# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,102 — 1960 අප්‍රේල් 8 වැනි සිකුරාද — 8.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදී)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 259 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 262 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | 276 |
| වැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 264 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ වැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 275 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 276 | විවිධ දැන්වීම් ... ... ... | — |



## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායසී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙසු සැමට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

**(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්‍ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.**

**සංලක්‍ෂ්‍යය.**—"නව ප්‍රවේශක නිලධාරීහු" යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්‍ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්‍ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද යි සඳහන් කොට එවිය යුතු ය.

**(ii) සම්මුඛ පරීක්‍ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපෙක්‍ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.**

**(iii) කිසියම් අපෙක්‍ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපෙක්‍ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්‍ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්‍ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.**

**(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.**

**(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්‍ෂෙප කරනු ලැබේ.**

---

## රජයේ ගබඩා දෙපාර්තමේන්තුව

### I ශ්‍රේණියේ ගබඩාකරු තනතුරු

රජයේ ගබඩා දෙපාර්තමේන්තුවේ, I ශ්‍රේණියේ ගබඩාකරු තනතුරු 6 ක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම් පත්‍ර, 1960 අප්‍රියෙල් මස 30 වැනි දින හෝ ඊට මත්තෙන් ලැබෙන සේ, කොළඹ, රජයේ ගබඩා දෙපාර්තමේන්තුවේ, ගබඩා අධිකාරි නමට එවිය යුතුයි :—

2. **වැටුප් ක්‍රමය :**—වාර්ෂික වැටුප් ක්‍රමය රුපියල් 2,700—120—3,780.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :**—

(i) මෙම තනතුරු ස්ථිරය. තෝරාගනු ලබන අපේක්‍ෂකයන් රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීමේ ක්‍රමයට අවුරුදු 3 ක ආධුනික කාලයක් සහිතව පත් කරනු ලැබේ. මෙම තනතුරු විශ්‍රාම වැටුප් සහිත ඒවා බවට පත් කිරීමට අවකාශ තිබේ. ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි රජයේ නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත්, පළමුවෙන් ඔහු එම තනතුරෙහි වැඩ බැලීමට පත් කරනු ලැබේ.

(ii) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් විසින් මුදලින් හෝ පිලිගත් ඉන්සුවරන්ස් සමාගමක් මගින් හෝ ඇප මුදලක් බැඳිය යුතුවේ.

(iii) තෝරාගනු ලබන අපේක්‍ෂකයන් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු පිණිසද, විශේෂයෙන්ම 1956 යේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාවේ යෙදීම පිණිසද, දැනට පනවා ඇති හෝ ‍මින් මතුවට පනවනු ලබන හෝ ව්‍යවස්ථාවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

4. **සුදුසුකම් :**—

(අ) හැම අයදුම්කරුවෙකුම, තමා විශිෂ්ඨ චරිතයකින් යුත් අයෙක් බවද,

(ආ) 1960.4.30 දිනට අවුරුදු 25 නොඅඩු හා අවුරුදු 45 ට වැඩි නොවන බවටද,

(ඉ) ජ්‍යෙෂ්ඨ විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත් බවටද,

(ඊ) ගබඩා දෙපාර්තමේන්තුවක අවුරුදු 5 ක පළපුරුද්දක්ද, සාමාන්‍ය ගබඩා වැඩ පිළිබඳ අවබෝධයක්ද "ස්ටොක්" පොත්, ලෙජර්ස් සහ අනිකුත් ගබඩා පිළිබඳ ලිපි ලේඛන නඩත්තු කිරීමට හැකි බවටද,

(උ) සංවිධාන හැකියාව සහ නිලධාරීන් හා කම්කරුවන් පාලනය කිරීමේ හැකියාව තිබෙන බවද ඔප්පු කළ යුතුය.

සැ. යු.—දැනට රජයේ සේවයේ නියුක්ත අපේක්‍ෂකයන්ට අනිත් අවශ්‍ය සුදුසුකම් තිබේ නම් වයස් සීමාව හා අධ්‍යාපන සුදුසුකම් ගැන නොසළකනු ලැබේ.

5. ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතික පිළිගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රය.

(ඉ) ළඟදී ලබාගත් චරිත සහතික තුනක් (මේ වගන්තිය යටතේ ඉදිරිපත් කළයුතු චරිත සහතික රජයේ දැනට සේවය කරන අපේක්‍ෂකයන්ගෙන් බලාපොරොත්තු නොවේ.)

6. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් විසින් එවනු ලබන ඉල්ලුම් පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තැනගේ මාර්ගයෙන් එවිය යුතුය. එවැනි ඉල්ලුම් පත්‍ර නියමිත දිනයට පසුව මෙම කාර්යාලයට ලැබුනොත්, ඒ අයදුම් පත් භාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තු ප්‍රධානයාට ලැබී තිබුණා නම්, එසේම ඒවා ප්‍රමාද වීමට සෑහෙන හේතු දක්වමින් එම අයදුම් පත් භාර ගන්නා ලෙස දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා නිර්දේශ කළ හොත් පමණි.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයේ පලවන රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත්කිරීම් පිළිබඳ වූ පොදු කොන්දේසි බලනු මැනවි.

ගබඩා අධිකාරී.

රජයේ ගබඩා දෙපාර්ත්මේන්තුව,
1960 අප්‍රියෙල් මස 2 වැනි දිනදීය.
කොළඹ.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**රජයේ ගබඩා දෙපාර්තමේන්තුවේ; I ශ්‍රේණියේ ගබඩාකරු තනතුර**

1. සම්පූර්ණ නම (අච්චු අකුරෙන්) :———.
   (අ) පෙලපත් නාමය :———.
   (ආ) සෙසු නම් :———.

2. ලිපිනය :———.

3. 1960 වේ අප්‍රියෙල් 30 වැනි දිනට නියමිත වයස (උප්පැන්න සහතික පිටපත ඇමිණිය යුතුයි) :———.

4. (අ) ඉල්ලුම්කරු ලාංකිකයෙක්ද යන වග :———.
   (i) එසේ නම් පෙලපතින්ද :———.
   (ii) නැතිනම් ලියා පදිංචි වීමෙන්ද :———.

   (ආ) උපන් ස්ථානය :———.
   (i) අයදුම්කරු :———.
   (ii) අයදුම්කරුගේ පියා :———.
   (iii) අයදුම්කරුගේ පියාගේ පියා :———.
   (iv) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :———.

සැ : යු : අයදුම්කරු සහ ඔහුගේ පියා යන දෙදෙනාම උපන්නේ ලංකාවේ නම් (i) සහ (ii) පමණක් පිරවීම සෑහේ. අයදුම්කරු හෝ ඔහුගේ පියා හෝ උපන්නේ ලංකාවේ නොවේ නම් (i), (ii), (iii) සහ (iv) යන සියල්ලම පිරවිය යුතුයි.

5. අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම් :————.

(අ) සමත් වූ උසස් ම විභාගය :—(සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුයි)————.

(ආ) අයදුම්කරුට ගබඩා දෙපාර්තමේන්තුවක අවුරුදු පහක පළ පුරුද්දක් තිබේ නම් ඒ බව දක්වන්න. එසේ නම් පත්වීමේ දිනය සහ සේවා විස්තර සඳහන් කරන්න. (සහතික පිටපත් ඇමිණිය යුතුයි :————.

(ඉ) වෙනත් හිමිකම් (තිබේ නම්) :————.

6. (අ) පාසලින් අස්වූවාට පසු යෙදී සිටි රක්ෂාව, දින සහ විස්තර සහිතව :————.

(ආ) රජයේ සේවයෙහි මීට පළමු යෙදී සිටියේ නම්, සේවය අවසන් වීමට හේතු විස්තර සහිතව දක්වන්න :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්, සේනාංකයේ සහ පදවියේ විස්තරද, එයට බැඳුන දිනය සහ අස්වන දිනයද සඳහන් කරන්න :————.

7. චරිත සහතික පත්‍ර සහ ඒවා ලබාගත් අයගේ නම් සහ ලිපිනය :————.

8. (අ) කිසියම් වරදකට, ඔබ කවදා හෝ චෝදනා ලැබ තිබේ නම් හෝ සිතාසි නිකුත් කරනු ලැබ තිබේ නම් හෝ ඒ බව සඳහන් කරන්න. (නඩු නොම්මරය සහ දිනය දක්වන්න).

(ආ) ඔබ රජයේ සේවයෙන් නෙරපනු ලැබුවේ නම් හෝ වැඩ නතර කරනු ලැබුවේ නම් ඒ වග :————.

(ඉ) රජයේ සේවයේ කවර තනතුරක් හෝ අතහැර ගියේ නම් ඒ වග :————.

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවරැදි බවට මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ඇතුළත් නම්, තේරීමට කලින් ඒවා අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු බවට පත්වන බවද තේරීමට පසු ඒ බව දැන ගන්නට ලැබුනොත් කිසිම වන්දියක් නැතිව, මා රාජකාරියෙන් පහකර දැමීමට යටත් වන බවද මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### තෙවැනි පෙළ සමුපකාර සමිති පරීක්ෂක වරුන්ගේ තනතුරු

සමුපකාර සමිති පරීක්ෂක තනතුරු හැත්තෑවකට පමණ ඇබෑර්තු තිබේ. ඒ සඳහා ඉල්ලුම් පත්‍ර මෙයින් කැඳවමි. එම ඉල්ලුම් පත්‍ර මේ දන්වීමට අදාළව ඇති පෝර්මය අනුව සකස් විය යුතුයි. එය රෙජිස්ටර් තැපෑලෙන් 1960 අප්‍රේල් 30 වෙනි දිනට ප්‍රථම මගේ කාර්‍යාලයට ලැබිය යුතුයි. මා වෙත ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ පහත දක්වෙන ලිපිනයටයි.

සමුපකාර සංවර්ධන කොමසාරිස්
තැ. පෙ. 419
**කොළඹ.**

මේ ලිපිනය ලියනලද ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළින් "පරීක්ෂක තනතුරු" යන්න ද ලිවිය යුතුය.

**2. වැටුප්**—තනතුරට අයත් වාර්ෂික වැටුප් මෙසේ වේ. සෝදිසි කාලයේදී රු. 960 කි. සේවය ස්ථිර කළවිට රු. 1,176 න් පටන් ගෙන වර්ෂයකට රු. 72 බැගින් වර්ෂ 21 ක් තුළ රු. 2,688 දක්වා වැඩි වේ. රු. 1,608 හා රු. 2,184 පෙර කාර්‍යක්ෂමතා කඩඉම් ඇත.

**3. පත්වීමේ කොන්දේසි**—මෙය විශ්‍රාම වැටුප් ඇති ස්ථිර තනතුරකි. වැන්දඹු හා අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතු වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග, මුදල් රෙගුලාසි, පාලන රෙගුලාසි, දෙපාර්තමේන්තුවේ නියෝග හා වරින්වර රජය මගින් නිකුත් කරන වෙනත් නියෝග හා රෙගුලාසි වලට ද පත්වූ කෙනෙකු යටත් වන්නේය. තමාට ලබාදෙන පුහුණුව ඉතා ඕනෑ කමින් කරගෙන යන බවට ද පුහුණුව අවසානයේ දී එසේ උවමනා කළ හොත් තෙවසකට නො අඩු කාලයක් තෙවැනි පෙළ සමුපකාර සමිති පරීක්ෂකයෙකු හැටියට දෙපාර්තමේන්තුවට සේවය කරන බවට ද පත්වූ සෑම අයදුම් කරුවෙක් ම සේවයට බැඳෙනවිට, දෙපාර්තමේන්තුව සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. මෙම ගිවිසුමේ කොන්දේසි නිසි ලෙස යථා කාලයේ දී ඉටු කරන බවට රු. 1,000 ක ඇප, එක් ඇපකරුවෙකු ඇති ඔප්පුවකින් තැබිය යුතුයි.

**4. අවශ්‍ය සුදුසු කම්**—සෑම ඉල්ලුම් කරුවෙකු ම පහත සඳහන් කරුණු ගැන සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1960 අප්‍රේල් 30 වෙනි දිනට වයස අවුරුදු 20ට නො අඩු බවත්, අවුරුදු 30ට නො වැඩි බවත්,

(ආ) ඉතා යහපත් චරිතයක්ද, නිරෝගි ශරීරයක් ද ඇත්තකු බව,

(ඉ) අංක ගණිතයෙන් හෝ වාණිජ ගණිතයෙන් හෝ මූලික ගණිතයෙන් හෝ සම්මාන සාමර්ථ්‍ය සහිතව ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වී ඇති බව හෝ ඊට සමාන නැතහොත් ඊට උසස් විභාගයකින් මූලික ගණිත ද සහිතව සමත් වී ඇති බව.

පොත් තැබීම, ගණන් තැබීම ආදිය ගැන දැනීමක් ඇති අයදුම් කරුවන් ගැන විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

**5. සේවා කොන්දේසි :—**

(අ) පත්වීම ස්ථිර කරනු ලබන්නේ අවුරුදු තුනක සෝදිසි කාලයකට පසුවය. එසේ පත්වීම ස්ථිර කිරීමට අවශ්‍ය සුදුසු කම් පහත දක්වේ—

(1) සමුපකාර අභ්‍යාස විද්‍යාලය මගින් පවත්වන පරීක්ෂක වරුන්ගේ පළමුවැනි විභාගයෙන් හෝ ඊට සමාන වෙනත් විභාගයකින් හෝ සමත්වීම. (අභ්‍යාස විද්‍යාලයේ පුහුණුවෙන් පසු දැවුරුද්දක් තුළ දී මෙම විභාගයෙන් සමත් නො වන අය සේවයෙන් අස් කරනු ලැබේ).

(2) සෝදිසි කාලයේ දී සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ඇති කරගැනීම සහ නියම කරනු ලබන තත්ත්වයක ප්‍රවීණතා විභාගයකින් සමත්වීම—(මෙම විභාගයෙන් අසමත් වන්නවුන් සේවයෙන් අස් කරනු ලැබේ). එහෙත් වැඩ සහ හැසිරීම අතින් සතුටුදායක වූ කෙනෙකු රාජ්‍ය භාෂාව ඉගෙනීමට නියම ප්‍රයත්නයක් දරන ලදැයි, දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට ඒත්තු ගියේ නම්, ඔහුගේ අස් කිරීම කල් දැමීමට ඉඩ තිබේ.

(ආ) පත් කරනලද නිලධාරීන්,

(1) ලංකාවේ කවර ප්‍රදේශයක වුවද සේවය කළ යුතුයි.

(2) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිසද, විශේෂයෙන්ම 1956යේ අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම පිණිසද, දැනට පණවා ඇති හෝ මින් මතුවට පනවනු ලබන හෝ ඕනෑම ව්‍යවස්ථාවකට අනුකූලව ද ක්‍රියා කළ යුතුය.

(ඉ) සමාන සේවා තත්ත්වයක් ඇති රජයේ සේවකයන්ට දෙනු ලබන නිවාඩු, ගෙවල් කුලී, ජීවන වියදම්, ගමන් වියදම් දීමනා ආදිය දෙනු ලැබේ.

6. සෑම ඉල්ලුම් කරුවෙක් ම පහත දක්වෙන සහතික වල පිටපත්, (මුල් පිටපත් නොව) තම ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය. (ඒ පිටපත් අයදුම් කරුවන්ට ආපසු දෙනු නොලැබේ.)

(1) උප්පැන්න සහතිකය (බව්තීස්ම සහතිකය හෝ අධ්‍යාපන සංග්‍රහයේ නියමයන් පිරිමැසීමට පාවිච්චි කරන උප්පැන්න සහතිකය හෝ පිළිගනු නො ලැබේ).

(2) ලබා ගත් උසස් ම අධ්‍යාපන සහතික,

(3) තම සුදුසුකම්, චරිතය, මේ තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාවය යන මේ සම්බන්ධයෙන් මෑතදී ලබා ඇති සහතික දෙකක්.

7. රජයේ සේවයේ නියුක්ත සේවකයන් විසින් එවනු ලබන ඉල්ලුම් පත්‍ර නියම කලට මේ දෙපාර්තමේන්තුවට නො ලැබුණොත් භාර ගනු නො ලැබේ. එහෙත් නියමිත දිනට පෙර ඒ ඒ අයගේ දෙපාර්තමේන්තු වලට ලැබුණ ඒවා නම්, ප්‍රමාදවීමට හේතු වශයෙන් පිළිගත හැකි කරුණු දක්වමින්, ඒ ඉල්ලුම් පත්‍ර පිළිගන්නා ලෙස ඒ ඒ දෙපාර්තමේන්තු වල ප්‍රධානීන් විසින් කියා සිටියොත් එය පිළිගැනීමට ඉඩ තිබේ.

8. ඉල්ලුම් පත්‍ර හෝ ඊට අදාළ සෙසු ලියකියවිලි හෝ සමුපකාර දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොව සමුපකාර සංවර්ධන කොමසාරිස් තැනට එවිය යුතුයි.

9. ගැසට් පත්‍රයෙහි පළමුවෙනි කොටසේ දෙ වෙනි ඡේදයේ මුල දක්වෙන රජයේ සේවයේ තනතුරු වලට පත්කිරීම් සම්බන්ධයෙන් සාමාන්‍ය කොන්දේසි ගැන ඉල්ලුම් කරුවන්ගේ අවධානය යොමු විය යුතුයි.

10. ඉල්ලුම් පත්‍ර ලැබුණු බවක් දන්වනු නො ලැබේ.

11. ඉල්ලුම් පත්‍රයක සඳහන් කරුණක් අසත්‍ය බැව් ඔප්පු වුවහොත් ඒ ඉල්ලුම්කරු මේ තනතුරකට පත්වීමට නුසුදුස්සෙකු වන්නේ ය. මේ බව ඔප්පුවූයේ ඉල්ලුම්කරු තනතුරකට පත්වීමට පසුව නම් ඔහුගේ නිලයෙන් ඔහු අස් කරනු ලැබේ.

12. මේ දැන්වීම අනුව පිළියෙල කර නැති සියලුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

පාලිත වීරමන්,
වැඩබලන සමුපකාර සංවර්ධන කොමසාරිස්.

1960 අප්‍රේල් මස 8 වැනි දින,
කොළඹ, සමුපකාර දෙපාර්තමේන්තුවේ දීය.

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### තෙ වැනි පෙළ සමුපකාර සමිති පරීක්ෂක වරුන්ගේ තනතුරු

1. සම්පූර්ණ නම :————.
   පෙළපත් නම (පැහැදිලි ලොකු අකුරෙන් ලිවිය යුතුය)
   වෙනත් නම් :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.
4. රටවැසි භාවය—
   1. ලාංකිකයෙක් නම් පරම්පරාවෙන්ද, ලියාපදිංචි කිරීමෙන්ද,
   2. පරම්පරාවෙන් ලාංකිකයෙක් නම්, පහත දැක්වෙන්නන්ගේ උපන් ස්ථානය දන්වන්න.
      (අ) ඉල්ලුම්කරු :————.
      (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
      (ඉ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා (සීයා) :————.
      (ඊ) ඉල්ලුම්කරුගේ පිය පක්ෂයේ සීයාගේ පියා :————.
5. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් (සහතිකවල මුල් ලිපි නොව පිටපත් අමුණා එවිය යුතුය).
6. පාසැලෙන් අස්වූවාට පසු කරනලද රැකී රක්ෂාවල විස්තර :————.
7. ඉල්ලුම් කරුගේ චරිතය ගැන සහතික දී තිබෙන අයගේ නම් සහ ලිපිනය :————.
   (මේ සහතිකවල පිටපත් මීට අමුණා එවිය යුතුයි).
8. තේරීමේ දී උපකාර විය හැකි විශේෂ සුදුසුකම් හෝ පළපුරුද්ද (දැන්වීමේ 4 (ඉ) බලන්න).
9. මීට පෙර රජයේ සේවයෙහි යෙදී සිටියේ ද? එසේ නම් කොතැන ද? කුමන කාලයකදී ද? ඉන් අස්වූයේ කුමක් නිසා ද? :————.

මේ ඉල්ලුම් පත්‍රයේ මා විසින් සඳහන් කර තිබෙන කරුණු සත්‍ය කරුණු බැව් මින් සහතික කරමි.

————.
ඉල්ලුම් කරුගේ අත්සන.

දිනය :————.

---

## කොළඹ වරාය කොමිෂම

### උප වැඩ පරීක්ෂක තනතුරු

වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුවෙහි උප වැඩ පරීක්ෂක තනතුරු 2ක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආකෘතිය අනුව තැනුණු අයදුම් පත් 1960.4.26 වැනි දිනට ප්‍රථම මෙම කාර්යාලයට ලැබිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය හා වෙනත් දීමනා.**—මෙම තනතුරුවලට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය රු. 1,860—120—3,780 වේ. රජයේ රීති ප්‍රකාර ජීවන වියදම් දීමනා හා ගෙවල් කුලී දීමනා ගෙවනු ඇත.

3. **සේවා තත්වය හා කොන්දේසි ආදිය :—**

(1) තනතුරු ස්ථිර හා විශ්‍රාම සහිත වේ.

(2) තෝරා ගනු ලබන අයදුම්කරු ඉතා කෙටි දැන්වීමක් ලැබුණ විගස පත්වීම භාර ගත යුතුයි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුත්තේ නම්—

(1) වයස අවුරුදු 20 නො අඩු බව,

(2) (අ) ඉංග්‍රීසි භාෂාව සමග කණිෂ්ඨය සමත්වී තිබෙන බව,

(ආ) සිවිල් ඉංජිනේරු විද්‍යාවේ මූලික කරුණු පිළිබඳ න්‍යායානුකූල දැනීමක් ඇති බව,

(ඉ) ගොඩනැගිලි තැනීම හා නඩත්තුව, බලවත් කළ කොන්ක්‍රීට් නිර්මානය (ගොඩනැගිලිවලට යොදන සුළු වැඩට අමතරව) විශාල වශයෙන් යොදන කොන්ක්‍රීට් වැඩ, භූමි වැඩ වැනි ගොඩනැංවීමේ වැඩ මාර්ග තැනීම හා නඩත්තුව ගැඹුරු කැණීම් හා ලී සවි කිරීම් සැපයීමේ කටයුතු ආදිය සම්බන්ධ හය අවුරුද්දකට නොඅඩු පළපුරුද්දක් ඇති බව, ගබඩා පාලනය හා බඩු ගෙන්වීම පිළිබඳ දැනීම හා කොන්ක්‍රීට් මිශ්‍රණ, නියුමැටික් බිඳින යන්ත්‍ර, කොම්ප්‍රෙසර් හා බුල්ඩොසර් යන්ත්‍ර ආදි සිවිල් ඉංජිනේරු නිර්මාණයට ආධාර වන යන්ත්‍ර සූත්‍ර පාවිච්චිය පිළිබඳ පළපුරුද්දක් ඇත්තන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. ඉහතකී සය අවුරුද්දෙන් යටත් පිරිසෙයින් තුන් අවුරුද්දක්වත් ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම් හා නඩත්තුවට අවශ්‍ය ද්‍රව්‍ය තක්සේරු කිරීම හා සේවකයන් 50 පමණවත් පරිපාලනය කරමින් තුන් අවුරුද්දක් පරිපාලන තනතුරක සේවය කර ඇති බව.

(ඊ) හොඳ චරිතයක් ඇත්තෙකු හා ශාරීරිකව සුදුසු විය යුතුයි.

5. පත්වීම ලැබීමට සුදුසු බව හා අයදුම්කරුගේ චරිතය සම්බන්ධවද මෑතදී ලබා ගත් සහතික 3 ක පිටපත් ඉදිරිපත් කළයුතුයි.

6. මෙම තනතුරු සම්බන්ධ අයදුම් පත් හෝ වෙනයම් ලියවිලි හෝ වරාය කොමසාරිස් තුමාට හැර මෙම දෙපාර්තමේන්තුවේ වෙනයම් නිලධාරියෙකුගේ පෞද්ගලික නමකට එවිය යුතු නැත.

7. රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් මේ ගැසට් පත්‍රයෙහි I වෙනි කොටසේ (II) වන ඡේදයේ මුල දැක්වෙන සාමාන්‍ය කොන්දේසි ඉල්ලුම්කරුවන්ගේ සැලකිල්ලට භාජන කරවනු ලැබේ.

අ. න. සි. කුලසිංහ,
වරාය කොමසාරිස් තුමා වෙනුවට.

වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 1960 මාර්තු මස 28 වැනි දින.

### ආකෘති පත්‍රය

#### වරාය කොමිෂන් සභාවේ උප වැඩ පරීක්ෂක තනතුරු

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. පුරවැසි බව (ලාංකිකයෙක්ද?) :————.
4. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් එවිය යුතුයි) :————.
5. අධ්‍යාපන සුදුසුකම් (සමත්වූ පංතිය) :————.
6. වෘත්තිය අධ්‍යාපනය හා පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර: ————.
7. ඉදිරිපත් කරනු ලබන සහතික ලබා ගත් අයගේ නම් හා තරාතිරම :————.
8. වෙනත් විස්තර ආදිය ඇතොත් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

භාණ්ඩාගාරයේ අංකය. 1/83/9(ඡී).

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ඉංග්‍රීසි)—1960වේ ජනවාරි

වර්ෂ 1960ක් වූ ජනවාරි මස 10 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී පහත සඳහන් ලඝු ලේඛකයන් සහ ලඝු ලේඛිකාව ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයයෙන්/විෂයයන්ගෙන් සමත් වී ඇති බැව් මෙයින් දන්වමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| ද සිල්වා, ඊ. සී. (මහත්මිය) | ... ලංකා කාර්මික විද්‍යාලය | රචනය සහ සිංහල |
| ද සිල්වා, එඩ්. එස්. | ... ජන ලේඛන සහ සංඛ්‍යා ලේඛන | රචනය |

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| පීරිස්, එම්. සී. ඩී. සී. | ... ආණ්ඩුවේ දේශ සංචාරක කාර්යාංශය | රචනය |
| ප්‍රනාන්දු, එම්. සී. එන්. ආර්. | ... මහේස්ත්‍රාත් උසාවිය, කළුතර | සිංහල |
| ප්‍රනාන්දු, එස්. ජේ. එම්. | ... නීති කෙටුම්පත්කරුගේ | ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, ඩබ්ලිව්. සී. එල්. | ... පොලිස් ... | රචනය |
| බෙනරගම, ඩී. එල්. ටී. | ... පොලිස් ... | රචනය සහ සිංහල |
| රෂීඩ්, ඒ. එල්. එම්. | ... දිස්ත්‍රික් උසාවිය, මහනුවර | රචනය සහ දෙමළ |
| සිරිසේන, සී. | ... ඉඩම් කොමසාරිස් ... | ලඝු ලේඛනය සහ රචනය |
| සිල්වා, එස්. ඊ. එල්. | ... අල්ලස් කොමිසම ... | ලඝු ලේඛනය |
| සෙනෙවිරත්න, එස්. පී. ජේ. | ... අධ්‍යාපන ... | ලඝු ලේඛනය |

2. පහත සඳහන් අපේක්ෂකයන් සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| පීරිස්, එම්. සී. ඩී. සී. ... | ආණ්ඩුවේ දේශ සංචාරක කාර්යාංශය |
| ප්‍රනාන්දු, එම්. සී. එන්. ආර්. ... | මහේස්ත්‍රාත් උසාවිය කළුතර |
| ප්‍රනාන්දු, එස්. ජේ. එම්. ... | නීති කෙටුම්පත්කරුගේ |
| ප්‍රනාන්දු, ඩබ්ලිව්. සී. එල් ... | පොලිස් |
| සිරිසේන, සී. ... | ඉඩම් කොමසාරිස් |
| සිල්වා, එස්. ඊ. එල්. ... | අල්ලස් කොමිසම |
| සෙනෙවිරත්න, එස්. පී. ජේ. ... | අධ්‍යාපන |

3. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් වීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයන් ද, එම පරීක්ෂණයට ඇතුළත් වීමේ සුදුසුකම් මීට කලින් ලබා ඇති අය ද, මීලග සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් වීම සඳහා තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් මඟින් විභාග කොමසාරිස්වරයා වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් යවන ලද ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුයි.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960ක් වූ අප්‍රේල් මස 4 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

භාණ්ඩාගාරයේ අංකය. 1/83/9(ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීමේ (ඉංග්‍රීසි) විභාගය—1960වේ ජනවාරි

වර්ෂ 1960ක් වූ ජනවාරි මස 9 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේදී පහත සඳහන් අස්ථිර සහ පරීක්ෂණ කාල සීමාවතුට යටත් ව පත්වීම් ලබා ඇති ලඝු ලේඛකයන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයෙන් / විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දැනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| කනගරාජා, එස්. | ... දිස්ත්‍රික් උසාවිය, කල්මුනේ | ඉංග්‍රීසි |
| ක්‍රාමර්, ඒ. එස්. | ... බන්ධනාගාර ... | ඉංග්‍රීසි |
| ඩයස්, කේ. ඒ. | ... විදුලි කර්මාන්ත ... | ඉංග්‍රීසි |
| ද සිල්වා, කේ. වී. | ... ප්‍රසිද්ධ වැඩ ... | සිංහල |
| නාරායනසාමි, වී. | ... ඒකාබද්ධ මහේස්ත්‍රාත් උසාවිය, කොළඹ | ඉංග්‍රීසි සහ දෙමළ |
| පීරිස්, ජේ. ඒ. ඩබ්ලිව්. | ... භාණ්ඩාගාරය ... | ඉංග්‍රීසි සහ සිංහල |
| පෙරේරා, එන්. ඒ. පී. | ... සෞඛ්‍ය ... | සිංහල |
| පෙරේරා, ජේ. ඒ. එන්. | ... දේශීය ආදායම් ... | ඉංග්‍රීසි |
| ප්‍රනාන්දු, කේ. ජේ. එල්. | ... අලෙවි කිරීමේ ... | ඉංග්‍රීසි |
| ප්‍රනාන්දු, කේ. බී. ජේ. | ... වරාය පාලන ... | ඉංග්‍රීසි සහ සිංහල |
| මුඩගම්මන, පී. පී. බී. | ... භාණ්ඩාගාරය ... | ඉංග්‍රීසි සහ සිංහල |
| ලාසරස්, ඒ. | ... වරාය පාලන ... | ඉංග්‍රීසි සහ දෙමළ |
| විජේගුණරත්න, කේ. වී. ඩී. පී. | ... මහේස්ත්‍රාත් උසාවිය, ගම්පහ ... | ඉංග්‍රීසි සහ සිංහල |
| විතානගේ, කේ. එම්. | ... මහේස්ත්‍රාත් උසාවිය, ගම්පොල | ඉංග්‍රීසි සහ සිංහල |
| විසර්, අයි. බී. | ... යුද්ධ හමුදා මූලස්ථානය | සිංහල |

2. පහත සඳහන් අපේක්ෂකයන් සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ලාසරස්, ඒ. ... | වරාය පාලන |
| විසර්, අයි. බී. ... | යුධ හමුදා මූලස්ථානය |

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960ක් වූ අප්‍රේල් මස 4 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### කණිෂ්ඨ කාර්මික විද්‍යාලය-ගාල්ල

**අධ්‍යයන වර්ෂය : 1960-61**

ඉහත සඳහන් මැයින් 1960 මාර්තු මස 18 වෙනි දින අංක 12,087 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ එම මස 19 වෙනි දින ප්‍රවෘත්ති පත්‍රවල පළවූ දැන්වීම් සම්බන්ධයෙනි.

ගාල්ලේ කණිෂ්ඨ කාර්මික පාඨශාලාවට ඇතුල්වීමේ ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය 1960 අප්‍රේල් මස 15 දින දක්වා කල්දමූ බව මෙයින් දන්වමි.

ඇල්. එච්. සුමනදාස,
වැඩබලන රෙජිස්ත්‍රාර්.

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව,
කොළඹ 10—2.4.60.

---

## තැපැල් ස්ථානාධිපති සහ සඥදයකයන්ගේ විභාගය—1959 ඔක්තෝබර්

වර්ෂ 1959 ඔක්තෝබර් මාසයේ පැවැත්වූ තැපැල් ස්ථානාධිපති සහ සඥදයකයන් තේරීමේ විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපේක්ෂකයන් පත්කිරීම පිණිස තෝරාගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| | නම | ලිපිනය |
|---|---|---|
| 1. | අබේරත්න බණ්ඩා, ඩී. ඇම්. ... | බුලත්වත්ත වලව්ව, උඩුගොඩ, වත්තේගම |
| 2. | අටුලුගම, ඒ. පී. ... | තැපැල් කාර්යාලීය සේවිංස් බැංකුව, කොළඹ |
| 3. | අරුලානන්දම්, ඇම්. ... | කියවීම් අංශය, ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ |
| 4. | එදිරිවීර, කේ. ඩබ්ලිව්. ... | පේදුරු වතුයාය, නුවරඑළිය |
| 5. | කරුණාරත්න, ටී. ඇම්. ... | කාලගුණ විද්‍යා කාර්යාලය, බදුල්ල |
| 6. | කැරගල, ඩී. ආර්. ඒ. ... | තැපැල් කාර්යාලය, බණ්ඩාරගම |
| 7. | කුඩාබණ්ඩා, ටී. ... | 94, පේදුරු තුඩුව පාර, තිරුනෙල්වෙලි නැගෙණහිර, යාපනය |
| 8. | කුලදස, එච්. කේ. ඒ. ... | වැය ශාඛාව, ප්‍රධාන තැපැල් කාර්යාලය, කොළඹ |
| 9. | කොඩිකාර, ඇන්. ටී. ... | පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්යාලය ප්‍රධාන තැපැල් කාර්යාලය, කොළඹ |
| 10. | ක්‍රිස්ටියන්, ඇම්. ... | 27, 6 වෙනි හරස්වීදිය, යාපනය |
| 11. | ගමලත්, ඩී. සී. ... | ඉඹුලහේන, ලියන්වල |
| 12. | ගුණපාල, ආර්. ඒ. ... | රග්ගල්කන්ද, අලව්ව |
| 13. | ගුණසේන, ඇන්. වී. කේ. ඇම්. ඩී. | පැලවත්ත, සිරිමාවත්ත, නායිමන, මාතර |
| 14. | චන්ද්‍රපාල, ඩී. පී. ඇල්. ... | 284, ඉහළ වීදිය, රක්වාන |
| 15. | ජයසේකර, ඇස්. ... | පොතුහැර |
| 16. | ඩයස්, අයි. ඇම්. ... | උප තැපැල් කාර්යාලය, ඇඹිලිපිටිය, |
| 17. | තිරුණාවුකාරසු, කේ. ... | තැපැල් සහ විදුලි සන්දේශ ගබඩාව, කොළඹ |
| 18. | ද අල්විස්, ජේ. පී. ... | කිඹීඇල, බද්දෙගම |
| 19. | ද සිල්වා, ඇම්. කේ. සී. ... | තැපැල් කාර්යාලය, හක්මන |
| 20. | ද සිල්වා, පී. ඩබ්ලිව්. ඇස්. ... | බෝගහවත්ත, අම්බලන්ගොඩ, |
| 21. | දිවිතුරගම, ඊ. ... | 851, අළුත්මාවත පාර, කොළඹ 15. |
| 22. | නියාම්, ඇම්. එච්. ඇම්. ... | ගා/වැලිතර ආණ්ඩුවේ මුස්ලිම් පාඨශාලාව, බලපිටිය |
| 23. | පරමසිවම්, ඇස්. ... | 61/35 දෙයියන්නෙවෙල, මහනුවර |
| 24. | පලනි, කේ. ඇම්. ... | අනලතිවු |
| 25. | ප්‍රනාන්දු, ඇන්. සී. ... | 150, ජයමාවත, කළුතර උතුර |
| 26. | බණ්ඩාරනායක, එච්. බී. ... | ගෝනදෙනිය, මැණික්දිවෙල |
| 27. | බාලසිංහම්, ඇස්. ඇස්. ... | මවුන්ට් කාමල් දෙවස්ථානය අසල, වාසවිලන් |

| | නම | | ලිපිනය |
|---|---|---|---|
| 28. | මනතුංග, ඇල්. ඇස්. | ... | 5/6, ලින්දවත්ත, මයිලගස්තැන්න, බදුල්ල |
| 29. | මුතුකුමාරසවාමි, ඇස්. | ... | 162, කස්තුරියාර් පාර, වන්නාර්, පොන්නයි |
| 30. | රාජපක්ෂ, ඩී. ජී. ඒ. | ... | 81, හලාවත පාර, මීගමුව |
| 31. | රාසයියා, වී. | ... | උප තැපැල් කාර්යාලය, නව්විමාර්, කොයිලඩි |
| 32. | රුද්‍රසිංහම්, ඇන්. | ... | ඇන්. විජයසිංහම් බාරේ, හිඟ අංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ |
| 33. | වාහලතන්ත්‍රි, ඩී. ජේ. | ... | 999, ගාලු පාර, කළුතර |
| 34. | විජේසූරිය, ඩබ්ලිව්. | ... | 205/27, පදවාතොට, මාගාල්ල, ගාල්ල |
| 35. | ශ්‍රී රංගරාජා, පී. | ... | ''වල්ලියනන්දම් විච'' තුන්නලායි උතුර, කරවෙඩ්ඩි |
| 36. | ෂරිප්දීන්, ඇම්. කේ. ඇම්. | ... | ආණ්ඩුවේ මුස්ලිම් පාසැල, හම්බන්තොට |
| 37. | සක්කරියාස්, ඇම්. | ... | ''සංගරවාස'' කන්දෙරෝදයි, චුන්නාකම් |
| 38. | සමරසිංහ, ඩබ්ලිව්. ඩී. ඇන්. | | තැපැල් කාර්යාලය, පොල්ගහවෙල |
| 39. | සිතම්පරනාදර්, කේ. | ... | කයිතඩි උතුර, කයිතඩි |
| 40. | සිරිසෝම, ආර්. ඇම්. ඇස්. | ... | පින්නදූව, වතුගෙදර, අම්බලන්ගොඩ |
| 41. | සිවප්‍රගාසම්, ඇස්. වී. | ... | ගණන් අංශය, තැ. පෙ. 540, කොළඹ |
| 42. | සෙල්වරාජා, ඇස්. ඒ. | ... | 80, බංගසාල වීදිය, යාපනය |

2. මේ අපේක්ෂකයන්ට වහාම තනතුරු සැපයීමට ආණ්ඩුව පොරොන්දු නොවේ. එහෙත් පුරප්පාඩු ඇතිවූ විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. සියලුම පත්වීම් දෙනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික කාලයක් පිට හා මෙම සේවයේ කොන්දේසිවලට යටත්වය.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරාල්.

1960 මාර්තු 28 වෙනි දින,
කොළඹ, ප්‍රධාන තැපැල් කාර්යාලයේදී ය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### අයි. සී. ඒ. ටෙන්ඩර් දැන්වීමයි

රජයේ වැඩ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ජූනි 29 වැනි දින පෙරවරු 9.30 දක්වා ලංකා විශ්ව විද්‍යාලයට ලෝහ ජනේල (ටෙන්ඩර් අංක : අයි. සී. ඒ. 270) සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර ටෙන්ඩර් කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 අප්‍රියෙල් 4 වැනිදින,
කොළඹ 1.

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), මෘදු වානේ රවුම් යකඩ සැපයීම සඳහා 1960 අප්‍රියෙල් 26 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1960 අප්‍රියෙල් 25 වැනි සඳුදා දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 අප්‍රියෙල් 8 වැනි දින,
කොළඹදීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කරදියන් ආරු හා සමන්තුරේ ගොවිපළවලට පොල් අතු හා උනබම්බු සැපයීම

මඩකලපු කෘෂිකර්ම ව්‍යාප්ත කිරීමේ නිලධාරි තැන විසින් පහත සඳහන් සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 අප්‍රේල් මස 29 වැනි දින පස්වරු 2.30 වන තෙක් බාරගනු ලැබේ :—

| | | |
|---|---|---|
| (අ) පොල් අතු කරදියන් ආරු ගොවිපොළට | ... | 30,000 |
| සමන්තුරේ ගොවිපොළට | ... ... | 7,500 |
| (ආ) කහ උනබම්බු 18" 4" කරදියන් ආරු ගොවිපළට | ... | 2,000 |
| කහඋනබම්බු 18" 6" කරදියන් ආරු ගොවිපළට | ... | 5,000 |

2. මඩකලපු කෘෂිකර්ම ව්‍යාප්ත කිරීමේ නිලධාරි තැන ගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා " කෘෂිකර්ම ව්‍යාප්ත කිරීමේ නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය මඩකලපුව" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "පොල් අතු/උනබම්බු සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් කෘෂිකර්ම ව්‍යාප්ත කිරීමේ නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "පොල් අතු/උනබම්බු සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවනලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුණොත් ඔහු මඩකලපු කෘෂිකර්ම ව්‍යාප්ත කිරීමේ නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර බාරගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු නොලැබේ.

පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා 10 දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකණු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ.

7. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවාවූද දේවල මූළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත්, ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා ද ඇත.

9. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත් කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ගෙවිය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂවෙත තබා ගනී.

11. පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි.

12. 1934රේ, 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපණත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත් කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

13. කොන්ත්‍රාත් කාරයාට බාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැළකිය යුතුයි.

14. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත් කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ හෝ තමාට සෑහේ යයි පෙනියන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

17. වැඩි විස්තර මඩකලපු කෘෂිකර්ම ව්‍යාප්ත කිරීමේ නිලධාරි තැන ගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 මාර්තු මස 2 වන දින,
පේරාදෙණිය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කුණ්ඩසාලේ පොම්ප ගෙයට වතුර පොම්ප සැපයීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 අප්‍රේල් 22 වැනි දින පස්වරු 2.30 වන තෙක් ඉහත සඳහන් පොම්ප සැපයීම සඳහා ආණ්ඩුවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

පෝර්ම කොළ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපළේ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත රුපියල් 10ක ඇප මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පමණක් ලබාගත හැක. වැඩි විස්තර සඳහා මේ ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි ටෙන්ඩර් දැන්වීම බලන්න.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 මාර්තු 31 දින,
පේරාදෙණියේ දීය.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ විසින් පහත සඳහන් උපකරණ ළඟ තිබෙන තොග වලින් සැපයීම සඳහා ටෙන්ඩර් 1960 අප්‍රේල් 29 වෙනි දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ :—

ගේජ් 14 ගැල්වනයිස් තහඩුවලින් සැදූ ගැලුම් 400ක් අල්ලන ජී. අයි. ටැන්කි 30 යි.

2. ටෙන්ඩර් සඳහන් කළ යුත්තේ දෙපාර්තමේන්තුවේ කිරිල්ල පොනේ පිහිටි බඩු ගබඩාවට භාර දිය හැකි මිළය. සඳහන් කරන මිළ ගණන් පසුව වෙනස් නොකරන ස්ථිර මිළ විය යුතු ය. ටෙන්ඩර පත්‍ර විසඳීමට භාජන කිරීම සඳහා අන්තිමට භාර ගන්නා දින සිට සති 4ක් ඇතුළත දී ටෙන්ඩර් පත්‍ර ඉල්ලා අස්කර නොගත යුතු ය. දැනට ළඟ තිබෙන තොගවලින් සැපයීමට නොහැකි නම් ඉක්මනින් සැපයිය හැකි දිනය සඳහන් කළ යුතු ය.

3. 1960 අප්‍රේල් මස 26 වෙනි දින දවල් 12 දක්වා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනුපිට පතකුත් සමඟ ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතු ය. මෙම කායාීලයේ හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 25ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් පෝරම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතු ය.

4. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම සීල් තබා "ජී. අයි. ටැන්කි සැපයීම" යනු කවරයේ වම්පස උඩ කෙළවරේ සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1 යන ලිපිනයට එවිය යුතු ය. ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය කවරයේ වම්පස පහත කෙළවරේ සඳහන් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රිකා ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් ගෙනැවිත් එච්ලන් චතුරශ්‍රය අසල පිහිටි ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරි තැනට භාර දී කුවිතාන්සියක් ලබා ගත යුතු ය.

5. 1960 අප්‍රේල් මස 29 වෙනි දින පෙරවරු 10.30ට ඉහත කී ගණකාධිකාර තැනගේ කාමරයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් ටෙන්ඩර් කරුවන්ට ඒ අවස්ථාවේදී පැමිණ සිටිය හැක.

6. යම් කොන්ත්‍රාත් කරුවෙකු තෝරා ගැනීමෙන් පසු අවශ්‍ය උපකරණ සැපයීමට අසමත් වුවහොත් හෝ පැහැර හැරියහොත් ඔහුගේ නම් රජයේ කිසිම කොන්ත්‍රාත්තුවකට සම්බන්ධ කර නොගන්නා කොන්දේසි කඩකළ කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනයට ඇතුලත් කරනු ලැබේ.

7. අවශ්‍ය ප්‍රමාණය සම්පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් පමණක් මිළයට ගැනීමට හෝ මුළුමනින්ම ප්‍රතික්ෂෙප කිරීමේ බලය ද නුසුදුසු අන්දමේ උපකරණ ප්‍රතික්ෂෙප කිරීමේ බලය ද දෙපාර්තමේන්තුව සතු ය.

සී. ද පොන්සේකා,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය,
කොළඹ 1.
1960 මාර්තු 28 වෙනි දින දීය.

---

## ඉබේ ක්‍රියා කරන "සෝ බෙන්ච්" සැපයීම

කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති (තැ. පෙ. 500, කොළඹ 1) විසින් ඉබේ ක්‍රියා කරන "සෝ බෙන්ච්" එකක් සැපයීම සඳහා ටෙන්ඩර් 1960 මැයි මස 3 වෙනි දින තෙක් භාරගනු ලැබේ.

2. 1960 අප්‍රේල් මස 29 වෙනි දින දාවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් සපයනු ලබන ටෙන්ඩර් පෝරමයේ අනු පිටපතකුත් සමග ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතුයි. එකී අධ්‍යක්ෂ තැනගේ කායාීලයෙහි හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 25ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් පෝරම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. කොළඹ ගාලු මුවදොර පිහිටි මහාලේකම් කායාීල ගොඩ නැගිල්ලේ අංක 355 දරණ කාමරයේදී 1960 මැයි මස 3 වෙනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමැති ටෙන්ඩර් කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

4. වැඩි විස්තර ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් විමසන්න.

ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ.

1960 අප්‍රේල් මස 2 වෙනි දින,
කොළඹ ඉඩම් සංවර්ධන කායාීලයේ දීය.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ඇලුමිනියම් තහඩු සැපයීම

කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට ඇලුමිනියම් වහල තහඩු සැපයීම සඳහා 1960 මැයි මස 3 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

| | |
|---|---|
| 7-0"×32 පීලි ඇලුමිනියම් තහඩු ... | 2,000 |
| 8-0"×32 පීලි ඇලුමිනියම් තහඩු ... | 1,000 |
| 10-0"×32 පීලි ඇලුමිනියම් තහඩු ... | 1,500 |
| ඇලුමිනියම් ඩයමන්ඩ් වොෂර් 20 ඇස්. ඩබ්ලිව්. ජී ¼ හෝල් ගේජ් ග්‍රොස් ... ... | 100 |
| සිදුර චතුරශ්‍රාකාර ¼" ඇලුමිනියම් නට් ග්‍රොස් ... | 100 |
| ඇලුමිනියම් වොෂර් සහිත වට ප්‍රමාණය ¼" හා 1, ¼" දිග ෂැන්ක් ඇලුමිනියම් බෝල්ට්ස් සහ නට්ස් ග්‍රොස් ... ... | 100 |

3. ටෙන්ඩර් පෝරම ලබාගැනීමට අප්‍රේල් මස 25 වෙනි දින තෙක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රිජිස්ටර් කොන්ත්‍රාත් කරුවන් කච්චේරියේ හෝ මුරුන්කන් වාරිමාර්ග කාර්‍යාලයේ රු. 25ක ඇපයක් තැන්පත් කළ විට ලබාගත හැක.

4. රුපියල් 17,000කට හෝ ඊට වැඩි රිජිස්ටර් කොන්ත්‍රාත් කරුවන්ට මින් එක ගොඩනැගිල්ලක් සඳහා ටෙන්ඩර් පෝරම ලබා ගත හැක.

වාරිමාර්ග ඉංජිනේරු තැන,
මන්නාරම් උප කොටස.

මුරුන්කන්, 30.3.60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වව්නියා උතුරු කොටස භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් යෝධ වැව ව්‍යාපාරයේ පූර්ව ගෙවල් හතරක් ඉදිකරවීම සඳහා අප්‍රේල් මස 26 වෙනි අඟහරුවාදා 9.30 වෙන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පෝරම ලබාගැනීම සඳහාත්, වැඩිදුර දැනගැනීම හා ප්ලෑන් බලා ගැනීමට මන්නාරමේ උප කොටස භාර මුරුන්කන් වාරිමාර්ග ඉංජිනේරු තැන හමුවන්න.

3. ටෙන්ඩර් පෝරම ලබාගැනීමට අප්‍රේල් මස 25 වෙනි දින තෙක්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රිජිස්ටර් කොන්ත්‍රාත් කරුවන් කච්චේරියේ හෝ මුරුන්කන් වාරිමාර්ග කාර්‍යාලයේ දී රු. 25ක ඇපයක් තැන්පත් කළ විට ලබාගත හැක.

4. රුපියල් 12,000කට හෝ ඊට වැඩි ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ට මින් එක ගොඩනැගිල්ලක් සඳහා ටෙන්ඩර් පෝරම ලබා ගත හැක.

වාරිමාර්ග ඉංජිනේරු තැන,
මන්නාරම් උප කොටස.

මුරුන්කන්, 30.3.60.

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### (නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

කොළඹ, එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42 දරණ ස්ථානයේ පිහිටා තිබෙන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ගොවිජන දෙපාර්තමේන්තුවට වී පාටකිරීම සඳහා "මැලචයිට් ග්‍රීන්" නමැති කොළපාට සායම් කුඩු හෝ ඊට සමාන සායම් කුඩු ටොන් දෙකක් සැපයීම සඳහා ප්‍රසිද්ධ වෙළඳුන් ගෙන් කැඳවනු ලබන ටෙන්ඩර් ඉල්ලුම් පත් 1960 අප්‍රියෙල් මස 29 වෙනි සිකුරාදා අ. භා. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

රුපියල් 25 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගන්නා ලද කුවිතාන් සියක් කොළඹ ඕර්ස් පාරේ අංක 336 දරණ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර 1960 අප්‍රියෙල් මස 29 වෙනි සිකුරාදා දවල් 12 වනතුරු තිකුත් කරනු ලබන ටෙන්ඩර් පත් ලබාගෙන අනුපිටපතක් සමග පුරවා එවිය යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවිය යුත්තේ කොළඹ, හෝටන් පෙදෙසෙහි අංක 60 දරණ ස්ථාන යේ පිහිටා තිබෙන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කාර්‍යාලයේ දීය.

සීල් තබනලද ටෙන්ඩර් පත් ටෙන්ඩර් අයදුම් කරුවන් විසින් සැපයීමට අදහස් කරන "මැලචයිට් ග්‍රීන්" සායම් කුඩුවල හෝ වෙන සායම් කුඩුවල සැම්පල් සීල් තබා ඔවුන්ගේ ටැන්ඩර් පත් සමග කොළඹ, එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42 දරණ ස්ථානයේ පිහිටා තිබෙන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට එවිය යුතුය.

වැඩි විස්තර කොළඹ, ඕර්ස් පාරේ අංක 336 දරණ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකිය.

කේ. සිත්තම්පලම්,
ගොවිජන සේවා කොමසාරිස් තැන වෙනුවට.
(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

1960 අප්‍රියෙල් 8 වෙනිදා,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඕර්ස් පාර, කොළඹ 10.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව සතු බොරැල්ලේ සර්පන්ටයින් පාරේ පිහිටි මූළුතැන්ගෙයි තිබෙන පාවිච්චියේමට නොහැකි බඩු බාහිරාදිය මිලදී ගැනීම සහ ගෙනයාම පිණිස ටෙන්ඩර් පත්‍ර, කොළඹ කොටුවේ චැතැම් වීදියේ පිහිටි අංක 62 දරන කාර්‍යාලයේ අලෙවි කිරීමේ කොමසාරිස්තුමා විසින් 1960 අප්‍රියෙල් 27 වෙනි බදාදා සවස 2.30 වන තෙක් භාරගනු ලැබේ.

ඒ සඳහා අවශ්‍ය පෝරම ඉහත සඳහන් කාර්‍යාලයෙන් ලබාගත හැක.

ඒ. ඩබ්ලිව්. ආර්. පෙරේරා,
අලෙවිකිරීමේ කොමසාරිස්තුමා වෙනුවට.

1960 මාර්තු 30 වෙනි දින,
කොළඹ කොටුවේ, 62, චැතැම් වීදියේ
අලෙවිකිරීමේ කොමසාරිස් කාර්‍යාලයේ දීය.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ තිබෙන ත්‍රිපොලි වෙළඳ හලට 1960.5.1 සිට 1960.5.31 දක්වා ඇති කාලය තුළදී අළුත් බිත්තර සැපයීම පිණිස ටෙන්ඩර 1960 අප්‍රේල් මස 19 වැනි අඟහරුවාදා අපරභාග 2.30 වන තෙක් කොළඹ යුනියන් ප්ලේස්හි පිහිටි ආහාර, වාණිජ හා වෙළඳ අමාත්‍ය කාර්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් 1960.4.19 වැනි දින දවල් 12 වනතුරු ලබාගතහැකි ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් පෝරමවල ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් දැනගත හැක.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවිකිරීමේ කොමසාරිස්තුමා වෙනුවට.

1960.3.25 වැනි දින,
කොළඹ 1, චැතැම් වීදියේ
අංක 62 දරන ස්ථානයේ පිහිටි
අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

### කොළඹ, ලෝටස් පාරේ පිහිටි ශීත කාමරයේ පළතුරු තැබීමට (ක්‍රේට්ස්) ලෑලි පෙට්ටි 3,000 ක් පමණ සපයා ගෙනදීම

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයිති කොළඹ, ලෝටස් පාරේ පිහිටි ශීත කාමරයේ පළතුරු තැබීමට වුවමනා අගල් 26" × 13" × 13" දිග පළලින් යුත් (ක්‍රේට්ස්) ලෑලි පෙට්ටි 3,000ක් පමණ, සපයා ගෙනදීම පිණිස ටෙන්ඩර් ඉල්ලුම් 1960 අප්‍රේල් 29 වැනි සිකුරාදා අපරභාග 2.30 වනතෙක්, කොළඹ 2, යුනියන් ප්ලේස්හි පිහිටි ආහාර, වානිජ සහ වෙළඳ ඇමති කාර්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පෝරම අනුපිටපතක් ද සහිතව ලබාගැනීම, කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62, දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක රු. 25ක් බැඳ කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1960.4.29 වැනි දින සිකුරාදා 12 වනතුරු වේ.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවිකිරීමේ කොමසාරිස් තැන වෙනුවට.

අලෙවි කිරීමේ කොමසාරිස් කාර්‍යාලය,
චැතැම් වීදියේ අංක 62, දරන ස්ථානය,
කොළඹ 1,
1960.3.26 වැනි දින.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ නාරාහේන්පිට තිබෙන පලතුරු පිත්වල ඇහිරීමේ ස්ථානයට සහ ගම්පහ දූම්පිය පොලට, ගම්පහ සහ උඩුගම්පොල පිහිටි අන්නාසි එකතුකිරීමේ මධ්‍ය ස්ථානවල සිට අන්නාසි ගෙනයාම පිණිස ටෙන්ඩර් 1960 අප්‍රියෙල් 21 වැනි බෘහස්පතින්දා අපරභාග 2.30 දක්වා කොළඹ යුනියන් ප්ලේස්හි පිහිටි ආහාර, වානිජ සහ වෙළඳ ඇමති කාර්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රුපියල් 100 ක් බැඳ කුවිතාන්සියක් ඉදිරිපත් කර 1960 අප්‍රියෙල් 21 වැනි බෘහස්පතින්දා දවල් 12 වන තුරු ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් පෝරම කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර ඉහත සඳහන් අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් දැනගත හැක.

ඇම්. ඩී. ඩබ්ලිව්. ආර්. සපරමාදු,
අලෙවිකිරීමේ කොමසාරිස්තුමා වෙනුවට.

1960 අප්‍රියෙල් මස 4 වැනි දින,
කොළඹ 1, අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වයඹ පලාතේ කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 අප්‍රේල් මස 29 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| පාසැලේ නම | | කළයුතු වැඩ |
|---|---|---|
| 1. කු/වැල්ලරාව සි. මි. පා. | ... | ගුරු නිවස අළුත්වැඩියා කිරීම. |
| 2. පු/පහළ පුළියන්කුලම සි.මි.පා. | | පාසැල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කිරීම. |
| 3. කු අබිබෝව සි. මි. පා. | ... | අළුත්වැඩියාව |
| 4. කු/කොස්වත්ත සි. මි. පා. | ... | එම |
| 5. කු/පානගමුව මු. පා. | ... | වැසිකිළි |
| 6. කු/පන්නාව මු. පා. | ... | එම |
| 7. කු/පන්නාව මු. පා. | ... | ළිඳ |
| 8. කු/අඹකඩවර සි. මි. පා. | ... | අළුත්වැඩියාව |
| 9. කු/රඹාවැව සි. මි. පා. | ... | ළිඳ |
| 10. කු/හැලම්බේගල සි. මි. පා. | ... | වැසිකිළි |
| 11. කු/හැලම්බේගල සි. මි. පා. | ... | ළිඳ |
| 12. කු/ඉහළදියදොර සි. මි. පා. | ... | ළිඳ |
| 13. කු/මිවැල්ලාව සි. මි. පා. | ... | ළිඳ |
| 14. කු/වහුමුව සි. මි. පා. | ... | වැසිකිළි |
| 15. කු/දීගල්ල ම. වි. | ... | ළිඳ |
| 16. කු/නිකගොල්ල සි. මි. පා. | ... | ළිඳ |

**සැ.යු.**—අංක 5, 6, 7, 9 සිට 16 දක්වා එක් වැඩක් සඳහා ටෙන්ඩර් පත් ලබාගැනීමට ඇප මුදල් වශයෙන් තැන්පත් කළ යුත්තේ රු. 10 පමණකි.

**සංලක්ෂ්‍යය** :—කු/කුරුණෑගල දිස්ත්‍රික්කය
පු/පුත්තලම දිස්ත්‍රික්කය

2. රුපියල් 7,500කට හෝ ඊට වැඩි ගණනකට ගොඩනැගිලි තැනීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ රු. 15,000 කට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී සිටින අයට, අධ්‍යාපන අධ්‍යක්ෂක තුමාගේ කාර්යාලයේ (ඒ.සී. ශාඛාව) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රු. 100 ක ඇප මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කරන්නාවූ අයට 1960 අප්‍රේල් මස 28 වන දින පස්වරු 3.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. චෙක්පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සි අධ්‍යාපන කාර්යාලයට පැමිණ අතින්ම භාරදී ටෙන්ඩර් පත්‍ර ලබාගත යුතුය. එසේ නැත හොත් එම කුවිතාන්සි සාමාන්‍ය තැපෑලෙන් නොව ලියාපදිංචි කරණ ලද තැපෑලෙන් මෙම කාර්යාලයට එවිය යුතුයි.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීම් පත්‍ර කුරුණෑගල වයඹ පලාතේ අධ්‍යාපන නිලධාරිතුමාගෙන් හෝ කොළඹ 2, අධ්‍යාපන අධ්‍යක්ෂතැනගේ කාර්යාලයේ (ඇස්. ඩබ්ලිව්. ශාඛාව) වෙන් හෝ ලබාගත යුතුය. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරණු ලබන්නේ 2 වන ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරණ අයට පමණකි.

5. පූර්වෝක්ත 2 වන ඡේදයේ සඳහන් වන පරිදි කුරුණෑගල, වයඹ පලාතේ අධ්‍යාපන නිලධාරිතැනගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමගය. සියලුම විස්තර තොරතුරු කුරුණෑගල, වයඹ පලාතේ අධ්‍යාපන නිලධාරිතැනගෙන් දැන ගත හැකිසි. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර "ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල" යන ලිපිනයට රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාරදී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩයේ නාමද ලියා තිබිය යුතුයි.

6. 1960 අප්‍රේල් මස 29 වන සිකුරාදා පස්වරු 2.30 ට කුරුණෑගල, අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ. එවිට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද ටෙන්ඩර් විවෘත කරණ නිලධාරිතැන විසින්, ටෙන්ඩර් කරුවන්ගේ නම්ද, ප්‍රමාණයන්ද (රේට් ගණන) පැමිණි අයට ඇසෙන්ට කියවනවා ඇත.

7. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසාන කර සති 6 කට නො අඩු කාලයක් තුල සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

8. වෙනත් අවශ්‍ය විස්තර කුරුණෑගල, වයඹ පලාතේ අධ්‍යාපන කාර්යාලයෙන් දැනගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂාකර බැලිය හැකිය.

9. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහිම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුයි. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුලත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයෙහි යෙදීමට අධ්‍යාපනාමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කළ කළ සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරණු ලැබීමටද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඩී. ඇස්. කලුගම්පිටිය,
කුරුණෑගල වැඩබලන වයඹ පලාතේ
අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කාර්යාලය,
කුරුණෑගල, 1960.4.2.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### දෙමළ පාඨශාලා පොත් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර—1959-60

දෙමළ පාඨශාලා පොත් සැපයීම සඳහා 1960 අප්‍රේල් මස 29 වන කිවි දින පස්වරු 2.30 වන තෙක් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වරයා විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර එවීමට බලාපොරොත්තු වන අය විසින්, විස්තර ලේඛන ඉල්ලා සිටි විට අධ්‍යාපනාධ්‍යක්ෂවරයා වෙනුවෙන්, කොළඹ 2 මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බඩු බාහිරා සැපයීමේ ශාඛාව විසින් ඒවා ඔවුනට නොමිළයේ සපයනවා ඇත.

3. කොළඹ ටෙන්ඩර්කරු භවතුන් විසින් අධ්‍යාපනාධ්‍යක්ෂ තැන නමට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඒ. සී. ශාඛාවෙහිද, කොළඹින් පිට අය විසින් කොළඹින් පිට කච්චේරියකද රුපියල් 100ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1960 අප්‍රේල් මස 29 වන දින තෙක් සාමාන්‍ය රාජකාරි කාලය තුළදී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

එල්. ඩී. එස්. කරුණාරත්න,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

1960 අප්‍රේල් මස 1 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### අපරදිග සංගීත භාණ්ඩ සැපයීම සඳහා ටැන්ඩර්පත්‍ර—1959-60

අපරදිග සංගීත භාණ්ඩ සැපයීම සඳහා 1960 අප්‍රේල් මස 29 වෙනි සිකුරාදා පස්වරු 2.30 වනතෙක් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටැන්ඩර් පත්‍ර එවීමට බලාපොරොත්තු වන අය විසින් විස්තර ලේඛන ඉල්ලා සිටි විට අධ්‍යාපනාධ්‍යක්ෂවරයා වෙනුවෙන් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාතීමේන්තුවේ බඩු බාහිරා සැපයීමේ ශාඛාව විසින් ඒවා ඔවුනට නොමිළයේ සපයනවා ඇත.

3. භාණ්ඩ සියල්ලටම හෝ වර්ග කිහිපයකට හෝ එක් වර්ගයකට හෝ එක් වර්ගයකින් කොටසකට හෝ ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

4. කොළඹ ටැන්ඩර්කරු භවතුන් විසින් අධ්‍යාපනාධ්‍යක්ෂ තැන නමට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඒ. සී. ශාඛාවෙහිද, කොළඹින් පිට අය විසින් කොළඹින් පිට කච්චේරියකද, රුපියල් 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1960 අප්‍රේල් මස 28 වෙනි දින තෙක් සාමාන්‍ය රාජකාරී කාලය තුළදී ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

එල්. ඩී. එස්. කරුණාරත්න,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

1960 අප්‍රේල් මස 1 වන දින,
කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන දෙපාතීමේන්තුවේදීය.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙහි ඒ. ඇම්. ශාඛාවේ තිබෙන "පවර් සමාස් " ගණන් තබන යන්ත්‍ර මිලදී ගෙනයාම

අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙහි ඒ. ඇම්. ශාඛාවේ තිබෙන "පවර් සමාස් " ගණන් තබන යන්ත්‍ර මිලදී ගෙන යාම සඳහා 1960 අප්‍රේල් මස 29 වන සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර එවීමට බලාපොරොත්තු වන අය විසින්, විස්තර ලේඛන ඉල්ලා සිටි විට අධ්‍යාපනාධ්‍යක්ෂවරයා වෙනුවෙන්, කොළඹ 2 මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බඩු බාහිරා සැපයීමේ ශාඛාව විසින් ඒවා ඔවුනට නොමිළයේ සපයනවා ඇත.

3. භාණ්ඩ සියල්ලටම හෝ වර්ග කීපයකට හෝ එක් වර්ගයකට හෝ එක් වර්ගයකින් කොටසකට හෝ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

4. කොළඹ ටෙන්ඩර්කරු භවතුන් විසින් අධ්‍යාපනාධ්‍යක්ෂ තැන නමට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඒ. සී. ශාඛාවෙහිද, කොළඹින් පිට අය විසින් කොළඹින් පිට කච්චේරියකද රුපියල් 100ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1960 අප්‍රේල් මස 28 වැනි දින තෙක් සාමාන්‍ය රාජකාරි කාලය තුළදී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

එල්. ඞී. එස්. කරුණාරත්න,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට..

1960 අප්‍රේල් මස 1 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

---

## රජයේ පාසැල්වලට සිංහල පුස්තකාල පොත් සැපයීම 1959-60

1960. 3. 11 දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පළවූ මගේ නිවේදනයට අමතරවයි.

2. ඉහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම 1960.4.22 දින තෙක් කල් දමන ලද බව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය වෙත මෙයින් දන්වමි. අධ්‍යාපන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ඉහත සඳහන් දින පෙරවරු 10.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

3. කොළඹ ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 2, මලයි වීදියේ ඒ. සී. ශාඛාවේ අධ්‍යාපනාධ්‍යක්ෂ වෙතද කොළඹින් පිට අය විසින් කොළඹින් පිට ඕනෑම කච්චේරියකද රුපියල් 100ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට රාජකාරි කාලය තුළදී 1960.4.21 දින දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

එල්. ඞී. එස්. කරුණාරත්න,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

1960 අප්‍රේල් මස 1 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

---

## ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව

කළුතර, රෙදි කැඳ දැමීමේ යන්ත්‍රස්ථානයකට ගොඩනැගිලි ඉදි කිරීම පිණිස ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960. 5. 8 දින පෙරවරු 10.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර භාර ගැනෙන්නේ රජයේ දෙපාර්තමේන්තු සඳහා රු. 1,50,000 සහ ඊට වැඩි වැඩ සාර්ථක ලෙස කර ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් පමණි. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීම සඳහා රු. 250 ඇප මුදලක් මේ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කර කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර සඳහා ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂක තැනගෙන් හෝ කළුතර, නාගොඩ දිස්ත්‍රික් නිලධාරි තැනගෙන් හෝ විමසන්න.

ඇම්. ඇස්. පෙරේරා,
ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂ.

60. 3. 28,
ටොරිංටන් චතුරශ්‍රයේදීය.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමන් විසින් පහත සඳහන් කර්මාන්ත යන් සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1960 මැයි මස 3 වැනි බදාදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ.

(1) කතරගම ආරෝග්‍යශාලාවේ විදුලි යන්ත්‍රය සවිකිරීම සඳහා ගොඩනැගිල්ලක් සෑදීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960 අප්‍රේල් 18 වැනි සිකුරාද සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 7,000ට වඩා වටිනාකමැති ගොඩනැගිලි කර්මාන්තයන් සඳහා රජයේ කොළඹ නගර සභාවේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ ලංකා බැංකුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම් කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ටොරින්ටන් චතුරශ්‍රයේ තැ. පෙ. 1434, ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාරගැනුමට බලය දී තිබෙන නිලධාරිතුමාට භාරදිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡෙදයේ ප්‍රකාර ටෙන්ඩර් භාරගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡෙදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේදී හැම ඉල්ලුම්කරුවෙකු ටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවෙල්,
වැඩ බලන ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7.
දිනය : 1.4.1960.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තයන් තැනීම සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1960 මැයි 17 වැනි බදාදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ.

(1) චාවකච්චේරි රෝහලට ජල සම්පාදන ක්‍රමයක් තැනීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960 මැයි 6 වැනි සිකුරාද සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 30,000 වඩා වටිනාකමැති ජල සම්පාදන කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැන්කුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම් කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ගාලු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කාර්යාලයේ අංක 159 දරණ කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපැලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපැලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරීතුමාට භාරදිය යුතුවෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීමට නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේදී සැම ඉල්ලුම්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවල්,
වැඩ බලන ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7,
28.3.60.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### හලාවත නිවාස යෝජනා ක්‍රමය සඳහා ජලසම්පාදන ක්‍රමයක් තැනීම

1960.2.26 දින දරණ ගැසට් පත්‍රයෙහි 1960.2.19 දාතමින් පළවූ ඉහත සඳහන් දැන්වීම සම්බන්ධයෙන් ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1960 අප්‍රේල් මස 22 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තෙක් දීර්ඝ කර ඇත.

1960 අප්‍රේල් මස 20 වෙනි බදාදා පස්වරු 3 වන තුරු මුදල් තැන්පත් කර ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැක.

ආර්. ඇල්. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

1960 මාර්තු මස 31 වෙනි දින,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### නුවරඑළිය, කොත්මලේ 1 ඔබ්ලිව් වර්ගයේ ගෙවල් 20 ක් තැනීම

නුවරඑළිය, කොත්මලේ, දෙන්සයිඩ් වතුයායේ 1 ඔබ්ලිව් වර්ගයේ ගෙවල් 20 ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 මැයි මස 20 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 80,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 80 ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 මැයි මස 18 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2,
1.4.1960.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### ගොතාටුව, බටලන්දහේන ගෙවල් 25 ක් සහ ළිං එකක් තැනීම

ගොතාටුව, බටලන්දහේන 1 ඩබ්ලිව්. වර්ගයේ ගෙවල් 15 ක්, 1 ඩබ්ලිව්. ඒ. වර්ගයේ 10 ක් සහ ළිං එකක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 මැයි මස 6 වෙනි සිකුරාද පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 100,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 100 ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 මැයි මස 4 වෙනි බදාද දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2, 31.3.1960.

---

## විදුලි දෙපාර්තමේන්තුව

### පිටරටින් ගෙන්වන සහ දැනට තිබෙන තොගවලින්, සිලින් සහ බ්‍රැකට්වල සවිකරන වර්ගයේ පවන්කා සැපයීමේ සහ භාරදීමේ ටෙන්ඩර් සම්බන්ධවයි

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සපයා කොලොන්නාවේ පිහිටි ඔහුගේ ගබඩාවට භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1960ක්වූ මැයි මස 25 වන බදාදා දවල් 12 දක්වා ප්‍රවාහණ සහ බලය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 574, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝරම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝරම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ය ටෙන්ඩර් කොන්දේසි ලෙඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළයුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝරම වලයි. වර්ෂ 1960ක්වූ මැයි මස 20 වන දින වන තෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1960ක්වූ මැයි මස 26 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10ට ප්‍රවාහණ හා බලය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1960ක්වූ අප්‍රියෙල් 8 වන දින දිය.

---

## විදුලි දෙපාර්තමේන්තුව

### නෝර්ටන් හි උප විදුලි බල ස්ථානයට කේ. වී 33කේ තෙල් මාර්ගයෙන් බල අයන ඡේදක සැපයීමේ සහ භාරදීමේ ටෙන්ඩර් සම්බන්ධවයි

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු හා කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සපයා නෝර්ටන් බ්‍රිජ්හි උප විදුලි බල ස්ථානයට භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1960 ක්වූ ජූනි මස 1 වන බදාදා දවල් 12 දක්වා ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 547, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝරම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝරම සැපයීමේ ගාස්තුව වන

මෙම නිලධාරිතැනගෙන් ලබාගත හැක. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලාගැනීමට පුළුවන.

වර්ෂ 1960 අප්‍රේල් මස 22 වෙනි සිකුරාදා පස්වරු 4 දක්වා, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 30,000කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත (අ) තමාගේ ලියාපදිංචි කිරීම පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රුපියල් 50 හා ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10ක් ද තැන්පත් කර ලබාගත් කුවිතාන්සි ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලයේ දීය.

ටෙන්ඩර් පත්‍ර කවරයක බහා, මුද්‍රා තබා එහි වම් පස උඩ "කෙළවරෙහි චුන්නාකම්හි "3ඒ" වර්ගයේ බංගලාවක් ඉදි කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර" යන්න සඳහන් කර, ලියාපදිංචි කළ තැපෑලෙන් 1960 මැයි මස 6 වෙනි සිකුරාදා පස්වරු 2.30ට පෙර ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලීය "ටෙන්ඩර් බෝඩ්" මණ්ඩලයේ සභාපති තැන වෙත ලැබෙන සේ එවිය යුතුයි. සවකීය ටෙන්ඩර් පත්‍රය තැපැල් මගින් එවීමට අකමැති නම් එය ඉහත සඳහන් කාර්යාලයේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය ලත් නිලධාරියෙකුට නියමිත වේලාවට පෙර භාරදී කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන.

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. අංක 370,
කොළඹ, 4.4.60.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

ජනසතු සේවා නැව් කටයුතු සහ ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1960 ජූනි මස 15 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට "මොනොටවර්" වර්ගයේ දොඹකරයක් සපයා භාර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1960 ජූනි මස 15 වෙනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් කායසාලයේ දී පරීක්ෂා කළ හැක. රු. 100 මුදලක් වරාය කොමිෂන් කායසාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් ෆෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1960 ජූනි මස 14 වෙනි අඟහරුවාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ. පිළිගත් ටෙන්ඩරය සඳහා ඇපකරුවන් අවශ්‍ය වී නම් එය සැපයීමට ටෙන්ඩර් කරු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් දින 60ක් සෑම ටෙන්ඩරයක්ම වලංගුව පවතී.

ඒ. ඇස්. කොහොඹන්වික්‍රම,
වරායේ කොමසාරිස්.

1960 අප්‍රේල් මස 1 වෙනි දින,
කොළඹ, වරාය කොමිෂන් කායසාලයේ දීය.

---

## ධීවර දෙපාර්තමේන්තුව

### මුතු බෙල්ලන් ගෝනි 2,500ක් විකිණීම

මුතු බෙල්ලන් ගෝනි 2,500ක් විකිණීම සඳහා ටෙන්ඩර් 1960 අප්‍රේල් 25 වැනි දින දවල් 12 වන තුරු, කොළඹ 1, සෙනේට් චතුරශ්‍රයේ කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාර ගන්නවා ඇත.

පහත අත්සන් කර ඇති අයගෙන් 1960 අප්‍රේල් 22 වැනි දින පස්වරු 3 වන තුරු ලබාගත හැකි ෆෝරම මගින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් 250කි.

ඩී. පී. ඊ. ඒ. ද ෆොන්සේකා,
ධීවර අධ්‍යක්ෂ.

1960 අප්‍රේල් 4,
කොළඹ 3,
ගාලු මුවදෙරදීය.

## ලඬකා ගමනාගමන මණ්ඩලය

විකිණීම පිණිස තිබෙන තට්ටු දෙකේ බස් බොඩි මිලට ගෙන හැරගෙන යාම සඳහා එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5 කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලඬකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960වේ අප්‍රියෙල් මස 20 වෙනි දා වන බදාදා පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ.

ටෙන්ඩර පත්‍ර නියමිත ෆෝරම කොළවල ලියා අනුපිටපතකින් ද යුක්තකොට එවිය යුතුයි. ඒ ෆෝරම කොළ බොරලැස් ගමුවේ වේරහැර පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක නිලධාරි කායසාලයෙන් 1960වේ අප්‍රියෙල් මස 19 වෙනි දා වන අඟහරුවාදා දවල් 12 වන තෙක් ලබාගත හැකිය.

ටෙන්ඩර ෆෝරම ලබාගැනීම සඳහා ටෙන්ඩර මුදලක් තැන්පත් කිරීම වුවමනා නොවේ.

ලඬකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1960වේ මාර්තු මස 24 වෙනි දින,
කොළඹදීය.

---

## මහනුවර කච්චේරිය

### මහනුවර දිස්ත්‍රික්කයේ ලිං කැනීම සහ ජල සම්පාදන වැඩ

පහත සඳහන් වැඩ සඳහා මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960.5.2 වැනි දින පෙරවරු 9.30 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| කටයුත්ත | පිහිටි ගම | ප්‍රා. ආ. නි. කොට්ඨාශය | ටෙන්ඩර් මුදල රු. ශ. |
| --- | --- | --- | --- |
| 1. ලිං දෙකක් කැනීම ... | මගුරුදෙනිය ගම් විශාල කිරීමේ ව්‍යාපාරය | හාරිස්පත්තුව | 25 0 |
| 2. ජල සම්පාදන ව්‍යාපාර වැඩ | රොත්ස්චයිල්ඩ් වත්ත | උඩ පළාත | 50 0 |
| 3. එම ... | ගුරුකැලේ නව ජනපදය | එම ... | 50 0 |
| 4. එම ... | නායපාන ව්‍යාපාරය | එම ... | 25 0 |

2. ටෙන්ඩර් පත්‍ර මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමාගෙන් ලබාගන්නා ලද ෆෝර්ම කොලවල පමණක්ම විය යුතුයි. පිළි ගන්නා ලද ෆෝර්ම කොලවල නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. ටෙන්ඩර් ෆෝර්ම පත් ලබාගන්නට ප්‍රථම එක එක වැඩය සඳහා ඉහත සඳහන් පළමුවෙනි ඡේදයේ සඳහන් ටෙන්ඩර් මුදල් මහනුවර කච්චේරියේ තැන්පත් කර ඒ වෙනුවෙන් ලැබෙන කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම කච්චේරියෙන් ලබාගත හැක්කේ 1960.4.29 වැනි දින දහවල් 12 දක්වා පමණී.

4. ටෙන්ඩර් පිටපත් දෙක බැගින් මුද්‍රා තබන ලද කවරයක බහා ලියා පදිංචි කළ තැපෑලෙන් මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත 1960.5.2 වැනි දින පෙරවරු 9.30 ට ප්‍රථම ලැබෙන පරිද්දෙන් එවිය යුතුයි. එක කවරයක එවිය යුත්තේ එක කටයුත්තක් සඳහා ටෙන්ඩර් පමණී. තවද කවරයේ පිට පැත්තේ වම් කෙළවරේ ටෙන්ඩර් එවන ලද කටයුත්තේ "වැඩයේ" නම පැහැදිළිව ලියා එවිය යුතුයි.

5. මෙම කාර්යය සම්බන්ධයෙන් වැඩි විස්තර මහනුවර කච්චේරියේ සංවර්ධන වැඩ පිළිබඳ අධිකාර තැනගෙන් ලබාගත හැක.

6. ටෙන්ඩරයේ මුළු මුදල ටෙන්ඩර් ෆෝර්මයෙහි අකුරින් හා ඉලක්කමින් සඳහන් කළ යුතුයි. අකුරින් ලියන ලද මුදල ඉලක්ක මින් ලියන ලද මුදලට වෙනස් වී ඇති හෝ මුළු මුදල අකුරින් සඳහන් කර නැති ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට අවකාශ තිබේ. ටෙන්ඩර් පත්‍රවල යම් මැකීමක් හෝ වෙනස් කිරීමක් ඇත්නම් ඒ සියල්ල ටෙන්ඩර්කරුගේ කොට අත්සනින් සහතික කළ යුතුය.

7. ඉහත සඳහන් කොන්දේසිවලට යටත් නොවන ටෙන්ඩර් නිෂ්ප්‍රභා කරනු ලැබේ.

8. මීට පෙර වතාවල වැඩ පැහැර හැරියේ යයි ආණ්ඩුව විසින් සම්මත කරනු ලැබූ ටෙන්ඩර් කරුවන්ගෙන් ටෙන්ඩර් භාරගනු නොලැබේ.

9. සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කිරීමේ බලයත්, යම් ටෙන්ඩරයක කොටසක් පමණක් භාරගැනීමේ බලයත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත රඳා පවතී.

10. ටෙන්ඩර් වසන දින පටන් සති තුනක් ඇතුළත කාලයේ දී කිසිම ටෙන්ඩර් කරුවෙකුට ඔහුගේ ටෙන්ඩරය ආපසු ගැනීමට බල යක් නැත. යම් ටෙන්ඩර් කරුවෙක් එසේ කළහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජ සන්තක කර, වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඔහුගේ නමත් ඇතුළත් කිරීමට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට බලය තිබේ.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ඉහත කී කර්මාන්තය නිසියාකාර කරන ලෙස, මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා සමග ගිවිසුමකට නොහොත් කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය. තවද ඔහු විසින් ටෙන්ඩර් කරන ලද මුළු මුදලෙන් සියයට 5 ක් ඇප වශයෙන් එකී ඒජන්තතුමා වෙත තැන්පත් කළ යුතුය.

12. මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් ලිය විල්ලකින් දන්වා දින 7 ක් ඇතුළත කාලයේදී, ගිවිසුමකට හෝ කොන්ත්‍රාත්තුවකට අත්සන් නොතබන හෝ ඇප මුදල තැන්පත් නොකරන ටෙන්ඩර් කරුවන්ගේ තැන්පත් මුදල රාජ සන්තක කරනු ලැබේ. එසේ කරනු ලබන අයගේද නම්, වැඩ පැහැර හරින කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට බලය තිබේ. අන් සෑම ටෙන්ඩර් ඇප මුදලක්ම තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ගිවිසුමකට නොහොත් කොන්ත්‍රාත්තුවකට අත්සන් කළායින් පසුව නිදහස් කරනු ලැබේ.

13. ටෙන්ඩර්කරු විසින් දෙන ලද අන්තිම ලිපිනයට ලියා පදිංචි කළ තැපැලෙන් එවන හෝ, ලිපිනයට බෙදාදෙන සෑම ලිය කියවිල්ලක්ම ඔහු විසින් ලත් බවට ඒත්තු ගනු ලැබේ.

14. ටෙන්ඩර් වසන දින පෙරවරු 10 ට සියළුම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේ දී ටෙන්ඩර් විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවකාශ දෙනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා සමග විධාන යොදාගෙන යම් ටෙන්ඩර් කරුවෙකුට ඔහුගේ ටෙන්ඩරයෙහි දෙවන පිටපත ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

15. ලියා පදිංචි කළ තැපැලෙන් ලැබෙන ටෙන්ඩර් ලත් බව, ටෙන්ඩර් විවෘත කරන දින දන්වනු ලැබේ. ලියා පදිංචි කළ තැපැලෙන් ටෙන්ඩර් එවීමට අකමැති ටෙන්ඩර් කරුවන් තමන්ගේ ටෙන්ඩර් පුද්ගලිකවම ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට හෝ එතුමාගේ බලයලත් අන් නිලධාරියෙකුට භාරදිය යුතුයි. ඒ නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුට එවේලේම ඊට කුවිතාන්සියක් දෙනු ලැබේ. එසේ භාරගත් ටෙන්ඩරය එම නිලධාරි තැන විසින් සභාපති තැනගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලනු ලැබේ.

16. මෙම ටෙන්ඩරය සම්බන්ධ කොන්දේසි හෝ වෙනත් කරුණක් වෙනස් කිරීමට සිදුවුවහොත් එසේ වෙනස් කරනු ලබන්නේ ටෙන්ඩර් විවෘත කළායින් පසුවය. එවැනි ක්‍රියා මාර්ගයක් ගැනීමට ප්‍රථම ටෙන්ඩර් මණ්ඩලය විසින් ටෙන්ඩර් කරුවන් සියළුදෙනාටම දැනුම් දෙනු ලැබේ. එවැනි වෙනස් කිරීමකට ප්‍රථම ඊට නියම අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්තුමාගේ අවසරය ලබාගැනීම අවශ්‍යය.

17. මෙම කොන්ත්‍රාත්තුවේ සෑම කර්මාන්තයක් සඳහාම කොන්ත්‍රාත්කරු විසින් ලාංකික කම්කරුවන්ම යෙදවිය යුතුයි. එසේම හැකිතරම් දුරට වැඩකරන ප්‍රදේශයෙන්ම කම්කරුවන් වැඩට බඳවා ගත යුතුයි. විශෙෂ අවස්ථාවකදී ඒජන්තතුමාගෙන් ගන්නා ලද ලියවිල්ලකින් ලත් අවසරය පිට ලාංකික නොවූ හෝ අන් පෙදෙසක කම්කරුවන් වැඩෙහි යෙදවිය හැක. එවැනි අවසර යක් නොමැතිව ලාංකික නොවූ හෝ අන් ප්‍රදේශයක කම්කරුවන් වැඩෙහි යෙදවීම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතුවේ.

ඇම්. පංචලිංගම්,
මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1960 අප්‍රේල් 2 වැනි දින,
මහනුවර කච්චේරියේ දීය.

---

අංකය : අයි/පී. කේ. ඇස්/493/2.

## පුත්තලම් දිස්ත්‍රික්කයේ සුලු වාරිකම් වැඩ

පහත දක්වන සුලු වාරිකම් වැඩ සඳහා මෙම කච්චේරියෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍රවල එවන ගණන් යෝජනා පත්‍ර 1960 අප්‍රේල් මස 20 වැනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ :—

1. කොලින්ජාඩිය බුන්කිඳ බැම්මේ අමුනක් ඉදිකිරීම.
2. ගල්මුරුව කඳන්ගොඩ බැම්මේ අමුනක් ඉදිකිරීම.
3. සොහොන්කල්ම පහලවැව වැඩි දියුණුකිරීම.
4. කෝන්කඩවල කඩවල වැවේ අමුනක් ඉදිකිරීම.

එක එක වැඩය වෙනුවෙන් රුපියල් දහයක මුදලක් තැන්පත් කිරීමෙන් 1960 අප්‍රේල් මස 19 වැනි දින පස්වරු 3 වනතුරු ගණන් යෝජනා ආකෘතිපත්‍ර ලබාගත හැක. සමුපකාර ආයතන සහ ග්‍රාම සංවර්ධන සමිති ගණන් යෝජනා ආකෘතිපත්‍ර ලබාගැනීමේදී මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නොවේ.

ගණන් යෝජනා පත්‍ර විවෘත කිරීම 1960 අප්‍රේල් මස 20 වැනි දින පෙරවරු 10ට පටන්ගන්නවා ඇත. ඒ වේලාවට ඉල්ලුම්කරුවන්ටද පෙනී සිටීමට අවසර තිබේ.

සේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුද්ගලිකව හෝ ලියවිල්ලකින් විමසීමෙන් මගෙන් ලබාගත හැක.

ඇම්. ප්‍රනාන්දු,
ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

1960 මාර්තු මස 31 වැනි දින,
පුත්තලම කච්චේරියේ දීය.

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

**දිස්ත්‍රික්ක කාර්යාලානුබද්ධ ගබඩාවලට අයත් පාවිච්චි කරන ලද සහ නොකරණ ලද වැඩිමනත් උපකරණ හා බඩු බාහිරාදිය විකිණීමයි**

පාවිච්චි කරන ලද සහ නොකරණ ලද වැඩිමනත් උපකරණ හා බඩු බාහිරාදිය මිලදී ගෙන ඉවත් කර ගැනීම සඳහා මුද්‍රා තැබූ මිල ගණන් පත්‍රිකා, වෂී 1960 අප්‍රියෙල් 29 දින පෙරවරු 10.30 දක්වා පහත සඳහන් දිස්ත්‍රික්භාර විධායක ඉංජිනේරු කාර්යාලවලදී භාර ගනු ලැබේ. ඒ ඒ දිස්ත්‍රික්කවල විකිණීම සඳහා තිබෙන ද්‍රව්‍යවල විස්තරයක් ඒ ඒ දිස්ත්‍රික්ක ඉදිරියෙන් සඳහන් කර ඇත.

මාතර : ආවුධ, වතු උපකරණ, ජල නළ හා ඇමුණුම්, බෝල්ට් ඇණ හා මුරිච්චි.

නුවරඑළිය : ආවුධ, ජල නළ හා ඇමුණුම්, බෝල්ට් ඇණ හා මුරිච්චි සායම් ආදිය.

විකිණීම සඳහා ඇති ද්‍රව්‍යයන්ගේ සම්පූර්ණ විස්තර සහ ඒවායේ සම්පූර්ණ ලැයිස්තු පහත සඳහන් ප්‍රකාර බලා ගැනීමට පුළුවන :—

(1) සියලුම දිස්ත්‍රික්කවලට අදාල විස්තර කොළඹ ට්‍රාන්ස් වර්ක් හවුස්හි රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේදී.

(2) එක් එක් දිස්ත්‍රික්ක සම්බන්ධ විස්තර, ඒ ඒ දිස්ත්‍රික් කාර්යාලවලදී සහ දිස්ත්‍රික්ක මාර්ග ඕවර්සියර්වරුන්ගේ නිවාස වලදී.

ඒ ඒ දිස්ත්‍රික්කයන්හි ද්‍රව්‍යවල විස්තර සහ ඒවායේ ලැයිස්තුවල පිටපත් ශත පණහක මුදලක් ගෙවීමෙන්, ඒ ඒ දිස්ත්‍රික්ක කාර්යාලවලින් ලබාගත හැකිය. එම මුදල ගෙවිය යුත්තේ, දිස්ත්‍රික්කය භාර විධායක ඉංජිනේරුවා වෙතය. මුදල් ගෙවීම මුදලින් හෝ එකී නිලධාරියාගේ නමින් ලියන ලද මුදල් ඇණවුම් හෝ තැපැල් ඇණවුම් හෝ චැක්පත් හෝ මගින් කළ හැකිය.

විකිණීමට ඇති කවර ද්‍රව්‍යයක කවර ප්‍රමාණයක් සඳහා වුවද මිල ගණන් පත්‍ර භාර ගනු ලැබේ. මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ. විස්තර පත්‍රිකාවෙහි දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව සකස් කර ගන්නා ලද පෝර්මයක මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

වී. ආර්සරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට.

1960 මාර්තු 26 දින,
කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ දිය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාතීමේන්තුව

**පේරාදෙනියේ විශ්ව විද්‍යාලයීය ගොඩනැගිලි යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කායාීලානුබඩ ගබඩාවෙහි තිබෙන වැඩිමනත් වානේ බඩු බාහිරාදිය මිලදී ගැනීම හා ඉවත් කර ගැනීම**

පේරාදෙනියේ විශ්ව විද්‍යාල ගොඩනැගිලි යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කායාීලානුබඩ ගබඩාවෙහි තිබෙන පහත සඳහන් වැඩිමනත් වානේ බඩු බාහිරාදිය මිලදී ගැනීම හා ඉවත් කර ගැනීම සඳහා ටෙන්ඩර් කොළඹ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 අප්‍රේල් 27 දු උදෑසන 10.30 දක්වා භාර ගනු ලැබේ. එදින 10.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන් පෙනී සිටිය යුතුය :—

නැවුම් යකඩ, පට්ටම් යකඩ, යකඩ තීරු, ආර්. ඇස්. ජොයිස්ට්ස්, එච් යකඩ, ඇන්ගල් ක්ලීට්ස්, තහඩු, බෝල්ට්ස් ඇණ හා මුරිච්චි.

2. මෙම බඩු බාහිරාදිය පේරාදෙනියේ විශ්ව විද්‍යාලයීය ගොඩනැගිලි යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයේ දී සාමාන්‍ය රාජ කාර්ය වේලාවන් හි පරීක්ෂා කළ හැක.

3. ටෙන්ඩර් ලියකියවිලි ද පේරාදෙනියේ විශ්ව විද්‍යාලයීය ගොඩනැගිලි යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයේ දී සෝදිසි කිරීමට සලසා ඇත. රජයේ වැඩ පිළිබඳ ප්‍රධාන කාර්යාලයේ දී හෝ වෙන ඕනෑම දිසාපති කාර්යාලයක රු. 25ක් තැන්පත් කළ බැව් හඟවන කුවිතාන්සියක් ඉදිරිපත් කර වර්ෂ 1960 අප්‍රේල් 22 වැනි සිකුරාද දවල් 12 දක්වා පේරාදෙනියේ විශ්ව විද්‍යාලයීය ගොඩනැගිලි යෝජනා ක්‍රමයේ ඉදි කිරීම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට පුළුවන. ටෙන්ඩර් කොන්දේසි අනුව තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

4. උපලේඛනයේ හා විස්තර සටහනෙහි ඇති ද්‍රව්‍ය කවර ප්‍රමාණයක් සඳහා වුවද ගැණුම්කරුවනට ඉල්ලුම් කළ හැක.

වී. අර්සරත්නම්,
ආණ්ඩුවේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

1960 මාර්තු 25 දින,
කොළඹ ට්‍රාන්ස්හවුස් හි ආණ්ඩුවේ වැඩ
දෙපාර්තමේන්තුවේදීය.

---

## පේරාදෙණියේ විශ්ව විද්‍යාලයීය ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කාර්යාංශයට අයත් පාවිච්චි කරන ලද/නොකරන ලද ඇති වැඩිමනත් බඩු බාහිරාදිය විකිණීම සඳහා මිල ගණන් පත්‍රිකා කැඳවීම

පහත සඳහන් වැඩිමනත් ආවුධ හා බඩු බාහිරාදිය මිලදී ගෙන ඉවත් කර ගැනීම සඳහා මුද්‍රා තැබූ මිල ගණන් පත්‍රිකා, වර්ෂ 1960 අප්‍රේල් මස 27 වැනි දින පෙරවරු 10.30 දක්වා පේරාදෙනියේ විශ්ව විද්‍යාලයීය ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන විසින් බාරගනු ලැබේ :—

(i) ආවුධ—අලුත් සහ පාවිච්චි කරන ලද;

(ii) විවිධ දේවල්—සායම්, ඩිස්ටැම්පර්, පිත්තල ඇණ යනාදිය;

(iii) ජලනල සහ ඇවුනුම්—අලුත් සහ පාවිච්චි කරන ලද;

(iv) දව, පරාල සහ පීප්ප—අලුත්.

2. විකිණීම සඳහා ඇති ද්‍රව්‍යයන්ගේ සම්පූර්ණ විස්තර සහ ඒවාගේ සම්පූර්ණ ලැයිස්තු පහත සඳහන් ප්‍රකාර බලා ගැනීමට පුළුවන :—

(i) කොළඹ ට්‍රාන්ස්වර්ක් හවුස් හි රජයේ වැඩ දෙපාර්තමේන්තු කාර්යාලයේ දී;

(ii) පේරාදෙනියේ විශ්ව විද්‍යාලයීය ගොඩනැගිලි පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයේ දී.

3. ද්‍රව්‍යවල විස්තර සහ ඒවායේ ලැයිස්තුවල පිටපත් ශත පනහක මුදලක්. ගෙවීමෙන් පේරාදෙනියේ විශ්ව විද්‍යාලයීය ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. එම මුදල ගෙවිය යුත්තේ පේරාදෙනියේ විශ්ව විද්‍යාලයීය ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන වෙතය. මුදල් ගෙවීම මුදලින් හෝ එකී නිලධාරියාගේ නමින් ලියන ලද මුදල් ඇණවුම් හෝ තැපැල් ඇණවුම් හෝ චෙක්පත් හෝ මගින් කළ හැකිය.

විකිණීමට ඇති කවර ද්‍රව්‍යයක කවර ප්‍රමාණයක් සඳහා වුවද මිල ගණන් පත්‍ර බාර ගනු ලැබේ. මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ. විස්තර පත්‍රිකාවෙහි දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුකූලව සකස් කර ගන්නා ලද පෝරමයක මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

වී. අර්සරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙනුවට.

1960 මාර්තු 25 දින,
කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

මාවනැල්ලේ තානායම අළුත්වැඩියා කිරීම සඳහා 1960 මාර්තු මස 11 වෙනිදා අංක : 12,077 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවූ ටැන්ඩර් දන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

ජී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ,
60.4.4.

---

## කොළඹ පිටකොටුවේ පොලීසියට අතිරේක නාන කාමර සෑදීම

කොළඹ පිටකොටුවේ පොලීසියට අතිරේක වැසිකිලි නාන කාමර සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 මැයි මස 4 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ නැගෙනහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 අප්‍රියෙල් මස 22 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 7,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්",

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ජී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.4.4.

---

කොළඹ ගාලු මුවදොර ලේකම් කාර්යාලයේ කැඩුණු දොරවල් ගලවා ඒ වෙනුවට අළුත් ඒවා සවි කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 මැයි මස 4 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ බස්නාහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 අප්‍රියෙල් මස 22 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 8,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්",

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.4.4.

---

අනුරාධපුර මධ්‍යම විද්‍යාලයේ ඇති නේවාසිකාගාරය විශාල කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 මැයි මස 4 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. අනුරාධපුරයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 වේ අප්‍රියෙල් මස 22 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 80,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝර්ට් කෝපරේෂන්",

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.4.4.

---

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම

## 1960 මාර්තු මස තුළදී බටහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් ටෙන්ඩර් පිළිබඳව ගත් තීරණ

| අංකය. | සේවය | ටෙන්ඩර් ඉදිරිපත් කළ අයගේ නම් | පිළිගත් ටෙන්ඩරය ඉදිරිපත් කළ අයගේ නම | පිළිගත් මිළ ප්‍රමාණය | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 1 | කොළඹ දිස්ත්‍රික්කයේ මොරන්න අමුණෙහි දෙරදෙකේ අමුණෙන් පහල හැරිගිය ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම | (1) කේ. ඒ. අමාරිස් අප්පුහාමි මයා, හිඟුරක්ගොඩ<br>(2) ඩී. ජේ. ජයවර්ධන මයා., උඩුගම්පොල<br>(3) ඇම්. පී. සේදිරිස් මයා, යක්කල<br>(4) කේ. ජේ. ප්‍රනාන්දු මයා, කොටුගොඩ<br>(5) ඩබ්ලිව්. ඩබ්ලිව්. ඇස්. චන්ද්‍රසේන මයා, වරකපොල | (1) ඩබ්ලිව්. ඩබ්ලිව්. ඇස්. චන්ද්‍රසේන මයා. | 15,453 0 ... | — |
| 2 | කොළඹ-5 ජාවත්ත පාරේ පිහිටි පස් පරීක්ෂණාගාරය පුළුල් කිරීම | (1) එච්. ඇම්. පෙරේරා මයා, කොළඹ 13 | (1) එච්. ඇම්. පෙරේරා මයා. ... | 6,269 50 ... | ලැබුණේ එකම ටෙන්ඩරයකි |
| 3 | රත්මලානේ සිනමා යන්ත්‍ර හා ප්‍රදර්ශක ශාලාවක් (ආධුනිකයන් පුහුණු කිරීමේ විද්‍යාලයක්) සෑදීම | (1) ඇස්. ඒ. ඇස්. ගුණසේකර මයා, පින්වත්ත ...<br>(2) යූ. පී. පෙරේරා මයා, කැළණිය<br>(3) එච්. ඇම්. පෙරේරා මයා , කොළඹ 13 | (1) එච්. ඇම්. පෙරේරා මයා, ... | 10,402 75 ... | — |

ප්‍රාදේශීය වාරිමාර්ග කාර්‍යාලය,
කොට්ටෙ පාර,
කොළඹ 8, 1960.4.2.

එස්. අරියතුරෙයි,
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන,
බටහිර කොට්ඨාශය.

---

## සුරාබදු දෙපාතීමේන්තුව

### ටැන්ඩර් ප්‍රතිඵල

| ටැන්ඩරයේ විස්තර | ටැන්ඩර්කරුවෝ | ප්‍රතිඵල |
|---|---|---|
| සුරාබදු දෙපාර්තමේන්තුවට අයත්, නුවර සහ කළුතර පිහිටි ගුදම්වලට, සම්පූර්ණයෙන් ස්වයංකාරී, නව, බෝතල් පිරවීමේ යන්ත්‍ර දෙකක් සැපයීම හා ස්ථාපනය කිරීම සඳහා ටැන්ඩර් | 1. ඊස්ටන් මැෂිනරි ඇන්ඩ් ට්රේඩින් කොම්පනි, විල්සන් පාර, බලාඩ් එස්ටේට්, බොම්බාය 1 (ඉන්දියාව)<br>2. කුමග් ඒ-ජී එන්ජිනියරින් වර්කස්, ලිට්සිග්‍රූබන්, සියුරිච් 40, (ස්විට්සර්ලන්තය) වෙනුවෙන් නැල්සන් ඒජන්සීස්, 845/5, 2 වෙනි කොට්ඨාශය, කොළඹ 10.<br>3. සීමාසහිත මෙටල් ක්ලෝෂර්ස්, වෙස්ට් බ්‍රොම්විච්, ස්ටෆර්ඩ්ෂයර්, (එංගලන්තය). | ඉතාලියේ ටොරිනෝහි බ්‍රිවෙට්ටි ඉන්ග් මසා මහතුන් විසින් ඉදිරිපත් කරන ලද ටැන්ඩරය භාර ගන්නා ලදි. භාරගත් ටැන්ඩරයේ මිළ රු. 6,01,729.54. |

| ටැන්ඩරයේ විස්තර | ටැන්ඩර් කරුවෝ | ප්‍රතිඵල |
|---|---|---|
| | 4. බ්‍රිචෙට්ටි ඉන්ග්. මසා,<br>කෝසෝ කැසේල්, 64 බිස්,<br>ටොරිනෝ (ඉතාලිය). | |
| | 5. සීමාසහිත ඉකුයිප්මන්ට් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් සමාගම,<br>7, කැනැල් රෝ,<br>කොළඹ 1. | |
| | 6. සීමාසහිත මෝගන් ෆෙපඅරස්ට්,<br>කාලිස්ල් වීදිය,<br>ෂෙෆිල්ඩ් 4 (එංගලන්තය). | |
| | 7. සීමාසහිත ඩෝෂන් සහෝදරයෝ,<br>ගොමර්සල් ලීඩ්ස්,<br>(එංගලන්තය). | |
| | 8. නැෂනල් පිල්ටර් කෝපරේෂන්,<br>147 බටහිර 22 වැනි වීදිය,<br>නිව්යෝක් 11 (ඇත්. වයි.)<br>(අ : එ : ජ :) | |

සුරාබද්දු ප්‍රධාන කාර්යාලය,
කොළඹ 6, 60.4.4.

මු. බ. දිසානායක,
සුරාබද්දු කොමසාරිස්තැන වෙනුවට

# බඩු බාහිරාදිය විකිණීම්

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීමයි

මාතර කෘෂිකම් කාර්යාලයේ, කෘෂිකම් ව්‍යාප්ති නිලධාරි තැන 1960 අප්‍රේල් මස 25 වෙනි දින උදේ 10ට මාපලාන රජයේ ගොවිපොලේ දී.

(1) බෝ කිරීමට නුසුදුසු වැස්සියන් තුන් දෙනෙක් ද,
(2) පට්ටි ගැසීමට නුසුදුසු ගොනෙක් ද,
(3) මෙරට වස් සත්. අට දෙනෙක් ද ප්‍රසිඩ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියෙන් ගන්නා ලද සතුන්ගේ වටිනාකම ඒ ස්ථානයේ දීම මුදලින්ම ගෙවා ඔවුන් ගොවිපොලෙන් ඉවත ගෙනයා යුතුයි.

ඇම්. ඇජ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ.

පේරාදෙණිය.
1960.3.23.

## කැලෑ දෙපාර්තමේන්තුව

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

කැලණිවැලි ගුඩ්ස්යාඩ්හි ලී ගබඩාවේ තිබෙන පිටරට යැවීමට සුදුසු වර්ගයේ බුරුත කොටන් 76ක්, 1960 වේ අප්‍රේල් මස 20 වැනි බදාදා උදේ 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර කොළඹ, මැක්ලම් පාරේ, කැලණිවැලි ලී ගබඩාව භාර කරුගෙන් දැනගත හැක.

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
වන සංරක්ෂක.

තැ. පෙ. 509,
කිව් පාර,
කොළඹ 2.

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## නොතාරිස් කෙනෙකු වශයෙන් ලියාපදිංචි කිරීමට ඉල්ලීම

ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තොට වල්ලල්ලාවිටි කෝරළයේ බෙන්තොට අංගාගොඩ පදිංචි පතිරගේ දොන් ඒබ්‍රහම් පතිරාජ වන මම මෙදින පටන් පුරා මාසයක් ගතවූ පසු ගාලු දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරණ ප්‍රසිඩ නොතාරිස් කෙනෙකු මෙන් ඇතුළත් කරගන්නා ලෙස රිජිස්ට්‍රාර් ජනරාල් තුමාගේ ඉල්ලා සිටින බව වර්ෂ 1907තේ අංක 1 දරණ නොතාරිස් ආඥපනතට සංශොධන කරන ලද 91 වන පරිච්ඡෙදයේ පළමුවන උපලෙඛනයේ "බී" කොට්ඨාශය 3.3.51 දතමින් සංශෝධනය කළ අංක 10,222 සහ 9.3.51 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් නියෝගයන්හි ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

පී. ඩී. ඒබ්‍රහම් පතිරාජ.

1960 මාර්තු 28 දින,
අංගාගොඩ,
බෙන්තොට.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.